
මහ රහතුන් වැඩි මඟ ඔස්සේ




# සප්ත විශුද්ධි ධර්ම



ඉදිරිපත් කිරීම

රුසිරු කන්නන්ගර

ධර්ම දානය පිණිස නොමිලේ බෙදා හැරෙන සදහම් තිළිණයකි...

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

# සප්ත විශුද්ධි ධර්ම

සිරස ගුවන් විදුලියේ ප්‍රචාරය වූ පන්සිල් මළුව වැඩසටහනේ දී සහ
දෙරණ නාලිකාවේ විකාශය වූ ධර්ම සාකච්ජාවක දී
අතිපූජ්‍ය රාජගිරියේ අරියඥාණ ස්වාමීන්වහන්සේ විසින්
කරනු ලැබූ දහම් කරුණු පැහැදිලි කිරීම්
අන්තර්ජාලයෙන් උපුටාගෙන විජේ ගුණවර්ධන මහතා විසින්
සකස් කළ මෙම දහම් පොත ඔබ සැමගේ
ධර්මාවබෝධය සඳහා පිළිගන්වමි.

ඉදිරිපත් කිරීම

**රුසිරු කන්නන්ගර**

© සමන් ප්‍රනාන්දු

ප්‍රථම මුද්‍රණය - 2018 මැයි

ISBN 978-955-7887-32-6

**වෙබ් පිටුව:**

**www.maharahathunwedimagaosse.com**
**www.mrwo.lk**

මෙතෙක් පළ වී ඇති පොත් පිළිබඳ සම්පූර්ණ විස්තරය සඳහා
පසුපස කවරයේ ඇතුල් පැත්ත බලන්න.

**විමසීම් -**

දුරකථන: 011 2755767
011 2755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 4.30 දක්වා)

**මුද්‍රණය සහ බෙදාහැරීම**
**ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්**
444/3B, පිටිපන දකුණ, හෝමාගම

(සෝයා තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ, විෂ රහිත, පරිසර හිතකාමී තීන්ත භාවිතයෙන් මුද්‍රිත යි.)

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
තියදුක, මේ අත්තභාවයේදීම
සසර දුකින් මිදෙන මිසම
අධිෂ්ඨානය කරන්න වීරිය වඩන්න
පිරිවා ඔබ ජරා "දුක්ඛ"
නිසි පරිදි උපමාව වටහාන්
මේ අනිත්‍ය ස්වභාවය
උපාකාලයන් සේමා, සෝතාපන්න වෙමා
නිර්වාණයට යෙමා
නව තණ්හාව වලංගු ප්‍රමාදය
නව තණ්හාවේ වින චල්ලා ගල්ලා ගන්නෙමා.
අද්‍ය හෝ වියතකාලය එළඹ අනෙත්
ඔබ නොකළ වරදකට
ඔබ නොගැලවේ,
ප්‍රණාමයට ආනුභාවයෙන්ටෙම,
චිත්ත නැගෙන සමුදේ වෙස
සමුදය ලෝකය දැකීමා.
වෙන සසරක් නැව අපිරිසිදුලෝකය
ඔබ සුවම යහපතක් වෙමා,
නවා නවාවම විස්ට නොව ගන්නෙමා.

*(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂූන් වහන්සේ විසින් ලියුවකි.)*

## ස්වාමීන් වහන්ස, සප්ත විශුද්ධි ධර්මයන් ආර්ය අෂ්ටාංගික මාර්ගයට ගලපා ගන්නේ කෙසේද?

සප්ත විශුද්ධි ධර්මයන් ආර්ය අෂ්ටාංගික මාර්ගයට ගලපා ගන්නේ කොහොමද කියන කාරණයේදී පින්වතුනි, අපි මුලින්ම සප්ත විශුද්ධීන් කියන කාරණය සිහිපත් කරගන්න ඕනේ.

සප්ත විශුද්ධීන් කියන කාරණය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළාවූ සූත්‍රයක නෙවෙයි, සඳහන් වෙන්නේ; **රථවිනීත සූත්‍රය** කියන්නා වූ සූත්‍රයේ. මේ රථවිනීත සූත්‍රය දේශනා කරන්නේ පින්වතුනි, රහතන් වහන්සේලා දෙනමක්. මේ රහතන් වහන්සේලා දෙනමක් අතර සිද්ධවෙන සුන්දර ධර්ම සාකච්ඡාවක් තමයි රථවිනීත සූත්‍රය කියලා කියන්නේ.

එතකොට මේ ධර්ම සාකච්ඡාව සිද්ධ වෙන්නේ **සාරිපුත්ත** මහෝත්තමයාණන් වහන්සේත්, ඒවගේම **මන්තානිපුත්ත පුණ්ණ** කියන්නා වූ මහ රහතන් වහන්සේත් අතරයි පින්වතුනි. මේ උතුම් රහතන් වහන්සේලා දෙනම අතර සිද්ධවෙන ධර්ම සාකච්ඡාව තමයි රථවිනීත සූත්‍රය. රථවිනීත සූත්‍රය තුළ තමයි ඔය සප්ත විශුද්ධි ධර්මයන් පිළිබඳව සඳහන් වෙන්නේ පින්වතුනි.

එක්තරා අවස්ථාවක ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සාරිපුත්ත මහ රහතන් වහන්සේ වැඩ සිටින තැනකදී පින්වතුනි, මේ මන්තානිපුත්ත පුණ්ණ කියන ස්වාමීන් වහන්සේව වර්ණනා කරනවා. මේ පුණ්ණ කියන මහ රහතන් වහන්සේ තුළ තිබෙන්නා වූ අප්‍රමාණ ගුණයන්, අප්‍රමාණ ඥාණයන් පිළිබඳව බුදුරජාණන් වහන්සේ වර්ණනා කරනවා. මේ වෙලාවේ සාරිපුත්ත මහ රහතන් වහන්සේට හිතෙනවා, "අනේ මටත් මේ පුණ්ණ මහ රහතන් වහන්සේ දකින්න ඇත්නම්, උන්වහන්සේත් එක්ක ධර්මය සාකච්ඡා කරන්න ඇත්නම් කොච්චර හොඳද" කියලා. මොකද මේ වෙන කොටත් සාරිපුත්ත මහරහතන් වහන්සේ පුණ්ණ රහතන් වහන්සේව හමුවෙලා හෝ දැකලා තිබ්බේ නැහැ.

දැන් මෙහෙම පුණ්ණ මහරහතන් වහන්සේ හමුවීමේ බලාපොරොත්තුවෙන් සාරිපුත්ත මහ රහතන් වහන්සේ ඉන්න කොට, උන් වහන්සේට ආරංචියක් ලැබෙනවා පුණ්ණ ස්වාමීන් වහන්සේ මේ ගමට වැඩම කරලා ඉන්නවාය කියලා. ඒ ආරංචිය ලැබිලා සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ පුණ්ණ මහ රහතන් වහන්සේ වැඩ සිටියාවූ කැලයට නැත්නම් ආරණ්‍යයට වැඩියා, පින්වතුනි. එහෙම ගමන් කරලා පුණ්ණ ස්වාමීන් වහන්සේ මුණගැහුණා.

මුණගැහුණාට පස්සේ, ස්වාමීන් වහන්සේලා දෙනමක් මුණ ගැසෙද්දී මුලින්ම අපි කරන්නා වූ ක්‍රියාවක් තියෙනවා පින්වතුනි. ඒ ක්‍රියාව තමයි අපි ඉස්සෙල්ලාම අහනවා "ඔබ වහන්සේට වස් කීයද" කියලා. වස් කීයද කියලා අහලා මට වඩා උන් වහන්සේට වස් වැඩි නම් පින්වතුනි, උන් වහන්සේට මම වන්දනා කරනවා. ඒක තමයි ස්වාමීන් වහන්සේලා දෙනමක් මුණ ගැසුනහම කරන මුල්ම කාරණය.

දැන් සාරිපුත්ත මහ රහතන් වහන්සේ පුණ්ණ ස්වාමීන් වහන්සේ මුණ ගැහුනා. නමුත් මේ දෙන්නා, දෙන්නාව හඳුනන්නේ නැහැ. නම් වශයෙන් හඳුනා ගත්තෙත් නෑ. වස් කීයද කියලා ඇහුවා. සාරිපුත්ත මහ රහතන් වහස්සේට වස් වැඩියි. අන්න පුණ්ණ මහ රහතන් වහන්සේ සාරිපුත්ත මහ රහතන් වහන්සේට ආසන පනවලා, වන්දනා කරලා වාඩි වුණා, පින්වතුනි.

මෙහෙම වැඩ සිටියාට පස්සේ සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ පුණ්ණ මහ රහතන් වහන්සේගෙන් අහනවා "පුණ්ණ ඔබ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ කුමක් අරමුණු කරගෙනද? පුණ්ණ ඔබ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ **ශීල විශුද්ධිය** උදෙසාද?" කියලා මුලින්ම අහනවා.

ඒ වෙලාවේ පුණ්ණ ස්වාමීන් වහන්සේ කියනවා "නෑ මම ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ **ශීල විශුද්ධිය** උදෙසා නෙවෙයි" කියලා.

දෙවනුව සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ විමසනවා "එහෙමනම් ආයුෂ්මතුනි, ඔබ වහන්සේ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ **චිත්ත විශුද්ධිය** උදෙසාද?" කියලා.

ඒ වෙලාවේ පුණ්ණ ස්වාමීන් වහන්සේ කියනවා "නැහැ මම ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ **චිත්ත විශුද්ධිය** උදෙසා නෙවෙයි" කියලා.

ඊළඟට අන්න තුන්වෙනි ප්‍රශ්නය අහනවා සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ "එහෙමනම් ආයුෂ්මතුන්, ඔබ වහන්සේ මේ ශාසන බ්‍රහ්ම චරියාවේ හැසිරෙන්නේ **දිට්ඨි විශුද්ධිය** පිණිසද?" කියලා.

ඒ වෙලාවේ පුණ්ණ ස්වාමීන් වහන්සේ පිළිතුරු දෙනවා "නැහැ ස්වාමීන් වහන්ස, මම ශාසනයේ බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ **දිට්ඨි විශුද්ධිය** උදෙසා නෙවෙයි" කියලා.

ඊළඟට හතරවෙනි ප්‍රශ්නය අහනවා සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ "එහෙම නම් ඔබ වහන්සේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ **කංඛාවිතරණ විශුද්ධිය** උදෙසාද?" කියලා.

ඒ වෙලාවේ පුණ්ණ ස්වාමීන් වහන්සේ කියනවා "නෑ ස්වාමීන් වහන්ස **කංඛාවිතරණ විශුද්ධිය** උදෙසා නෙවෙයි මම ශාසන බ්‍රහ්ම චරියාවේ හැසිරෙන්නේ" කියලා.

දැන් ඊළඟට පස්වෙනි ප්‍රශ්නය අහනවා සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ "එහෙමනම් ආයුෂ්මතුන් ඔබ වහන්සේ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ **මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධිය** උදෙසාද" කියලා.

"නෑ ස්වාමීන් වහන්ස **මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධිය** උදෙසා නෙවෙයි මම මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ" කියලා පුණ්ණ ස්වාමීන් වහන්සේ කියනවා.

ඊළඟට අන්න හයවෙනි ප්‍රශ්නය අහනවා සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ "එහෙමනම් ආයුෂ්මතුන් වහන්ස,

ඔබ වහන්සේ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ **ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධිය** උදෙසාද?" කියලා.

ඒ වෙලාවේ පුණ්ණ ස්වාමීන් වහන්සේ කියනවා "නෑ ස්වාමීන් වහන්ස, මම මේ ශාසන බ්‍රහ්ම චරියාවේ හැසිරෙන්නේ **ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධිය** උදෙසා නෙවෙයි" කියලා.

ඊළඟට හත්වෙනි ප්‍රශ්නය සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ අහනවා "එහෙමනම් ආයුෂ්මතුන්, ඔබ වහන්සේ මේ ශාසන ප්‍රතිපදාවේ හැසිරෙන්නේ **ඤාණ දස්සන විශුද්ධිය** උදෙසාද" කියලා.

එතනදිත් පිළිතුරු දෙනවා, පුණ්ණ ස්වාමීන් වහන්සේ "නෑ ස්වාමීන් වහන්ස, මම මේ ශාසන ප්‍රතිපදාවේ හැසිරෙන්නේ **ඤාණ දස්සන විශුද්ධිය** උදෙසා නෙවෙයි" කියලා.

දැන් අන්න ඒ වෙලාවේ සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ පෙරලා ප්‍රශ්න කරනවා "ආයුෂ්මතුන්, මම ඔබෙන් ඇහුවා ඔබ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ ශීල විශුද්ධිය උදෙසාද කියලා, ඔබ කියනවා නැහැ කියලා."

මම දෙවනුව ඔබෙන් ඇහුවා ඔබ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ චිත්ත විශුද්ධිය උදෙසාද කියලා. ඒත් ඔබ වහන්සේ කියනවා නෑ කියලා.

තුන් වෙනුව මම ඔබ වහන්සේගෙන් ඇහුවා, ඔබ වහන්සේ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ දිට්ඨි විශුද්ධිය උදෙසාද කියලා. ඒත් ඔබ වහන්සේ කියනවා නෑ කියලා.

හතර වෙනුව මම ඔබ වහන්සේගෙන් ඇහුවා, ඔබ වහන්සේ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ කංඛාවිතරණ විශුද්ධිය උදෙසාද කියලා. ඒත් ඔබ වහන්සේ කියනවා නැහැ කියලා.

ඊළඟට මම ඔබ වහන්සේගෙන් ඇහුවා, ඔබ වහන්සේ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය උදෙසාද කියලා. ඒත් ඔබ වහන්සේ නැහැයි කියනවා.

ඊළඟට මම ඔබ වහන්සේගෙන් ඇහුවා ඔබ වහන්සේ මේ ශාසනයෙහි බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධිය උදෙසාද කියලා. ඒත් ඔබ වහන්සේ නෑ කියනවා.

ඊළඟට මම ඇහුවා ඔබ වහන්සේ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ ඤාණ දස්සන විශුද්ධිය උදෙසාද කියලා. ඒත් ඔබ වහන්සේ නැහැ කියනවා.

''එහෙම නම් ආයුෂ්මතුන් ඔබ වහන්සේ මේ ශාසන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙන්නේ කුමන අර්ථයක් උදෙසාද'' කියලා සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ විමසනවා.

ඒ වෙලාවේ පුණ්ණ ස්වාමීන් වහන්සේ දේශනා කරනවා සුන්දර උපමාවක්, පින්වතුනි.

දැන් මේ ස්වාමීන් වහන්සේලා දෙන්නා නම් වශයෙන් තවම හඳුනන්නේ නැහැ. පුණ්ණ ස්වාමීන් වහන්සේ දන්නේ නැහැ මේ සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ කියලා. නමුත් සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ දන්නවා මේ පුණ්ණ ස්වාමීන් වහන්සේ කියලා.

සාරිපුත්ත මහ රහතන් වහන්සේ මේ ප්‍රශ්නය අහන්නේ මේ කාරණය උන්වහන්සේ නොදන්න හින්දා නෙවෙයි, පින්වතුනි. සුන්දර ධර්ම සාකච්ඡාවක්, සුන්දර ධර්ම අර්ථයක්, ඔබටත්, මටත් ලබා දීමේ අරමුණෙන් මයි.

ඊළඟට පුණ්ණ ස්වාමීන් වහන්සේ සුන්දර උපමාවක් කියනවා, සාරිපුත්ත මහ රහතන් වහන්සේට. කොසොල් රජතුමා ඉන්නවා. කොසොල් රජතුමාට **සාකේත** නුවරට යන්න අවශ්‍යතාවක් ඇති වෙනවා. ඒක ලොකු හදිස්සියක්. කොසොල් රටේ ඉඳලා සාකේත නුවරට යන්න. කිලෝ මීටර 80 ක් විතර දුර තියෙනවා කියලා අපි හිතමු. කොසොල් රජතුමා ඉක්මනට සාකේත නුවරට යන්න අවශ්‍ය නිසා තමන්ගේ රාජ්‍ය භටයන්ට, ඇමතීන්ට කියනවා වාහන හතක් මගින් මගට තියන්න කියලා පින්වතුනි.

අපි කියමු කිලෝ මීටර 80 ක් දුරක් තිබ්බා කියලා. කිලෝ මීටර දහයෙන් දහයට අශ්ව කරත්ත හතක් තිබ්බා, පින්වතුනි. දැන් රජතුමා පලමුවෙනි අශ්ව කරත්තයට නැග්ගා. කිලෝ මීටර දහයක් ගිහිල්ලා ඒ අශ්ව කරත්තෙන් බැහැලා දෙවෙනි අශ්ව කරත්තයට නගිනවා. එතනින් කිලෝ මීටර දහයක් ගිහිල්ලා තුන්වෙනි අශ්ව කරත්තයට, හතරවෙනි, පස්වෙනි, හයවෙනි අශ්ව කරත්තෙන් ගිහිල්ලා හත්වෙනි අශ්ව කරත්තෙන් සාකේත නුවරට යනවා පින්වතුනි.

දැන් සාකේත නුවරට ගියාට පස්සේ, සාකේත නුවර රජතුමාට මේක හරි ප්‍රශ්නයක්. කොසොල් රජතුමාගෙන් අහනවා "ඔබ වහන්සේ මෙච්චර ඉක්මනට මේ ගමන ආවේ මේ අශ්ව රථයෙන්ද?" කියලා. පින්වතුනි. එතකොට එහෙම නම් කොසොල් රජතුමා ප්‍රකාශ කළොත් "මම මෙච්චර ඉක්මනට මේ ගමනාන්තයට ළඟා වුණේ මේ අශ්ව කරත්තයෙන්" කියලා, ඒක ඇත්ත උත්තරයක් වෙන්නේ නෑ පින්වතුනි. හයවෙනි අශ්ව කරත්තෙන්ද කියලා ඇහුවොත් ඒකත් ඇත්ත උත්තරයක් වෙන්නේ නෑ. පස්වෙනි, හතරවෙනි තුන්වෙනි, දෙවෙනි, පලමුවෙනි අශ්ව කරත්තෙන් ද කියලා ඇහුවොත් ඒකත් ඇත්තක් වෙන්නේ නෑ පින්වතුනි. මොකද මේ අශ්ව කරත්ත හතම, මේ ගමනාන්තයට ඉක්මනින් එන්න උපකාරක ධර්මයක් සකස් කරලා දුන්නා පින්වතුනි.

ඒ නිසා පුණ්ණ ස්වාමීන් වහන්සේ කියනවා සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේට, මෙන්න මේ සප්ත විශුද්ධීන්ම මට මේ ශාසන බ්‍රහ්ම චරියාවේ හැසිරීම උදෙසා හේතු වුණා කියලා පුණ්ණ ස්වාමීන් වහන්සේ දේශනා කරනවා.

එතකොට මොකක්ද මේ සප්ත විශුද්ධීන් කියලා කියන්නේ?

දැන් කෙනෙක් කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබනවා. සද්ධර්මය ශ්‍රවණය කරනවා. ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරනවා. ඒ නුවණින් මෙනෙහි කිරීම තුළ පින්වතුනි එයා සම්මා දිට්ඨි, සම්මා සංකප්පයන් තුළ ශක්තිමත් කෙනෙක් බවට පත් වෙනවා. බුදු රජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගය

පනවද්දි, බුදුරජාණන් වහන්සේ ප්‍රඥාවට අදාළ මාර්ග අංග දෙක හැටියට දේශනා කරන්නේ සම්මා දිට්ඨියයි. සම්මා සංකප්පයයි, පින්වතුනි.

එතකොට මේ ප්‍රඥාව කියන්නේ ආර්ය ප්‍රඥාව නෙවෙයි. විදර්ශනාමය ප්‍රඥාව නෙවෙයි. මේ ප්‍රඥාව කියන්නේ පින්වතුනි, මාර්ගය හඳුනා ගැනීමේ ප්‍රඥාවයි. ලෞකික ප්‍රඥාවයි. මේ ලෞකික ප්‍රඥාව සද්ධානුසාරී සහ ධම්මානුසාරී දෙන්නා තුළ තියෙනවා, පින්වතුනි.

මේ ලෞකික ප්‍රඥාව පිරිහෙන ස්වභාවයෙන් යුක්ත වූ ප්‍රඥාවක්. මේ ලෞකික ප්‍රඥාව තමයි පින්වතුනි, අපව මාර්ගයට යොමු කරන්නා වූ ප්‍රඥාව. ඒ නිසා එයා සම්මා දිට්ඨියෙන් සම්මා සංකප්පයෙන් ශක්තිමත්. අන්න එතන ඉඳන් තමයි එයා පලමුවෙනි රථයට ගොඩ වෙන්නේ, පින්වතුනි.

එතකොට නිවන් මාර්ගය උදෙසා මේ සංසාර බය, දුක නිවා ගැනීම උදෙසා යන්නා වූ මේ ගමනේදී පින්වතුනි, අපි පලමුවෙනිව නගින්නා වූ රථය තමයි ශීල විශුද්ධිය කියලා පුණ්ණ මහ රහතන් වහන්සේ දේශනා කරන්නේ.

එහෙනම් මේ නිවන් මාර්ගය සොයාගෙන යන පින්වතුන්ලා මේ ජීවිතයේදී ම උතුම් සෝවාන් ඵලය සාක්‍ෂාත් කරගන්න බලාපොරොත්තු වන පින්වතුන්ලා, මේ නව වසරේ මම උතුම් සෝවාන් ඵලය සාක්ෂාත් කර ගන්නවා කියලා අධිෂ්ඨානයක් ඇති කර ගත්ත පින්වතුන්ලා, පින්වතුනි මෙන්න මේ සූත්‍ර ධර්මයට අදාළව මාර්ගය තුළ ශක්තිමත් වෙන්න ඕනේ.

මොකද සෝවාන් ඵලය කියන කාරණය ඉබේ ලැබෙන දෙයක් නෙවෙයි. හේතුඵල ධර්මයක්. ඒ හේතු ඵල ධර්මයන් සකස් කරන්නේ මේ සප්ත විශුද්ධි මාර්ගය තුළ මයි පින්වතුනි. ඒ නිසා නිරතුරුව ම මේ පුණ්ණ ස්වාමීන් වහන්සේ මුල්ම රථය හැටියට අපට දේශනා කරන්නේ මොකක්ද? ශීල විශුද්ධිය. එයා ශීලයෙන් පිරිසිදු භාවයට පත් වෙනවා පින්වතුනි.

ඒ කියන්නේ උපසම්පදා භික්ෂූන් වහන්සේ නමක් නම් උන් වහන්සේ උතුම් ප්‍රාතිමෝක්ෂ ශීලය තුළ ශක්තිමත් වෙනවා. බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා සුළු වරදේ හෝ බියක් ඇති කර ගන්නා වූ භික්ෂුව පින්වතුනි, පුරපසට යන සඳක් සේ දවසින් දවස, දවසින් දවස ආලෝකයෙන්, ප්‍රඥාවේ ආලෝකයෙන් දීප්තිමත් වෙනවා කියලා. පුරපසට යන සඳක් සේ කියලා, දේශනා කරනවා බුදුරජාණන් වහන්සේ. ඒ වගේම පුංචි වරදේ හෝ බිය නොදකින භික්ෂූන් වහන්සේ, අවපසට යන්නා වූ සඳක් සේ දවසින් දවස, දවසින් දවස අඳුරටම යනවා කියලා බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා.

ඒ නිසා මේ මාර්ගය තුළ ලෞකික ප්‍රඥාව ඇති කරගත්ත තැනදී, සම්මා දිට්ඨියෙන්, සම්මා සංකප්පයෙන් ශක්තිමත් වෙච්ච තැනදී පින්වතුනි, අන්න එයා ගොඩ වෙනවා ශීල විශුද්ධිය කියන රථයට.

දැන් එයා උපසම්පදා භික්ෂූන් වහන්සේ නමක් නම් උතුම් ප්‍රාතිමෝක්ෂ ශීලය තුළ එයා ශක්තිමත් වෙනවා. සාමනේර ස්වාමීන් වහන්සේ නමක් නම් උතුම් සාමනේර දස ශීලය තුළ සහ සේඛියා 75 තුළ අන්න ශක්තිමත් වෙනවා, පින්වතුනි.

ඒ වගේම ගිහි පින්වතෙක් නම් එයා පංච ශීලය තුළ ශක්තිමත් වන කෙනෙක් බවට පත්වෙනවා. එයා පසළොස්වක පොහොය දවසට උපෝසථ ශීලය සමාදන් වෙනවා. නිරතුරුවම ශීලයේ ශක්තිය ජීවිතයට එකතු කර ගන්නවා.

එහෙනම් පින්වතුනි මේ මාර්ගය තුළ, මේ නිවන් මාර්ගය තුළ, මේ නිවීම තුළ, මේ භව නිරෝධය තුළ අපි මුලින්ම නගින අශ්ව කරත්තය තමයි පින්වතුනි ශීල විශුද්ධිය. එහෙනම් බලන්න සමාජය තුළ පින්වතුන්ලා තමන්ගේ හෘද සාක්ෂියට තට්ටු කරලා අහන්න, ගෞරවණීය ස්වාමීන් වහන්සේලා වන අපි අපේ හෘද සාක්ෂියට තට්ටු කරලා අහන්න, අපි බලාපොරොත්තු වෙන්නේ නිවන් මාර්ගය නම් පින්වතුනි, අපි මේ පලමුවෙනි රථය තුළ ශක්තිමත් වෙලාද කියන කාරණය දකින්න. අපි

තාම පලමුවෙනි රථයට නගින්න අදක්ෂ වෙලානම් අපට නිවන් මාර්ගයක් ගැන කතා කරන්න දෙයක් නෑ, පින්වතුනි.

තාමත් උපසම්පදා භික්ෂූන් වන අපට උතුම් ප්‍රාතිමෝක්ෂ ශීලය ආරක්ෂා කර ගන්න බැරිනම් එය ආරක්ෂා කර ගැනීම උදෙසා වීර්යය ඇති කර ගන්න ශක්තියක් අපට නැත්නම් පින්වතුනි, සාමනේර ස්වාමීන් වහන්සේට උතුම් දස ශීලය ආරක්ෂා කරගන්න, සේඛියා 75 ආරක්ෂා කරගන්න ශක්තියක්, වීර්යයක් නැත්නම්, ගිහි පින්වතුන්ලා හැටියට පංච ශීලය ආරක්ෂා කරගෙන ජීවත් වෙන්න තාම අපට ශක්තියක් නැත්නම් පින්වතුනි, ඒ කියන්නේ තවම අපි නිවන් මාර්ගයට අදාල රථ හතෙන් පලමුවෙනි රථයට තවම නැගලා නැහැ පින්වතුනි. තවම අපි පලමුවෙනි රථයට ගොඩ වෙලා නැහැ.

ඒ නිසා පින්වතුන්ලා නිරතුරුව දකින්න මේ නිවන් මාර්ගය උදෙසා බුදු රජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගයට අදාල අංග අටෙන් අංග තුනක් ශීලයට වෙන් කරනවා, පින්වතුනි. සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ කියන අංග තුන.

ඒ නිසා ශීලය අත්‍යවශ්‍ය දෙයක්. ශීලය නමැති රථයට නොනැග පින්වතුනි, ඉතුරු රථ හය කවදාවත් ම ඔබට මුණ ගැහෙන්නේ නම් නෑ. ඒ නිසා අන්න ශීල විශුද්ධිය තුළ එයා ශක්තිමත් වෙනවා.

එතකොට ශීල විශුද්ධිය කියලා කියන්නේ මේ ධර්ම මාර්ගය තුළ ගමන් කරන භික්ෂුව වේවා, ගිහි පින්වතා වේවා, එයා ශීලයෙන් මුලින්ම පරිපූර්ණ භාවයට පත් වෙන්න ඕන.

එතකොට ශීලයෙන් පරිපූර්ණ භාවයට පත් වෙද්දි, බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වන අපට සතර ශීලයක් පිළිබඳව දේශනා කරනවා. එතකොට පලමුවෙනි ශීලය තමයි ප්‍රාතිමෝක්ෂ ශීලය. සිල්පද 227 කින් යුක්ත, උපසම්පදා භික්ෂුවක් දිවිහිමියෙන් ආරක්ෂා කර ගන්නා වූ ශීලය. මොකද ශීලයෙන් තොරව ධර්ම මාර්ගයක් කොතනක වත් නැහැ, පින්වත්නි.

නමුත් වර්තමාන සමාජයේ මතයක් පැතිරෙනවා ශීලයෙන් තොරව නිවන් අවබෝධ කර ගන්න පුළුවන් කියලා. ශීලයට වටිනාකමක් නොදී සෝවාන්, සකෘදාගාමී, අනාගාමී ඵලයන් සාක්ෂාත් කර ගන්න පුළුවන් කියලා කියනවා. ස්වාමීන් වහන්සේලා අතර ඉන්නවා, "මම සෝවාන් ඵලයට පත්වෙලා. නමුත් මම දොලහෙන් පස්සේ ආහාර ගන්නවා" කියන ස්වාමීන් වහන්සේලා. උන්වහන්සේලා ම කියනවා "මම සෝවාන් ඵලයට පත් වෙලා" කියලා. නමුත් උන් වහන්සේ දොලහෙන් පස්සේ ආහාර ගන්නවා. ඒ කියන්නේ ඒක කවදාවත් වෙන්න පුළුවන් දෙයක් නෙවෙයි.

සෝවාන් පුද්ගලයා කියන්නේ තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවට ආපු කෙනෙක්. ශීලය ආර්ය ශීලයක් හැටියට වඩපු කෙනෙක්. ඒ වගේ සමාජය තුළ යම් මතයක් ගොඩ නැගෙනවා, ශීලයෙන් තොරව සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් ඵලයන් කරා යන්න පුළුවන් කියලා. ඒක සම්පූර්ණයෙන් ම මිථ්‍යාවක්.

ශීලයෙන් තොරව කවදාක්වත් විදර්ශනා නුවණක්, අධිගමයක් කියන කාරණයක් අපට බලාපොරොත්තු වෙන්න බැහැ. මොකද බුදු රජාණන් වහන්සේ දේශනා කරන්නේ මේ සම්මා සම්බුද්ධ ශාසනය කියන්නේ ශීලයමයි. ශීලයෙන් තොරව ශාසනයක් නැහැ. ශීලයෙන් තොරව ශාසන අධිගමයක් කවදාක්වත් නැහැ.

ඒ නිසයි බුදු රජාණන් වහන්සේ දේශනා කරන්නේ "ඔබ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම තුළ ආර්ය අෂ්ටාංගික මාර්ගයට බැස ගත්තා නම් ඔබ මුලින්ම නගින රථය තමයි අන්න ශීල විශුද්ධිය කියලා කියන්නේ."

එතනදී සතර ශීලයක් ගැන බුදු රජාණන් වහන්සේ අපට දේශනා කරනවා උපසම්පදා භික්ෂුවක් නම් ප්‍රාතිමෝක්ෂ ශීලය තුළ අපි ශක්තිමත් වෙන්න ඕනේ. සිල්පද 227 ක්. එතකොට සාමනේර ස්වාමීන් වහන්සේ නමක් නම් සාමනේර දස ශීලයත්, සේඛියා 75 ත් කියන ධර්මතාවය තුළ අප ශක්තිමත් වෙන්න ඕන. එතකොට ගිහි පින්වතෙක් නම් එයා පංචශීලය තුළ ශක්තිමත් වෙන්න ඕන.

ඊළඟට බුදු රජාණන් වහන්සේ අපට දේශනා කරන්නේ ඉන්ද්‍රිය සංවර ශීලය. අපි නිරතුරුවම මේ ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස සංවරව තියාගන්න ඕන. ඇසෙන් රූපයක් දැකලා, ඒ දැක්කා වූ රූපය ගැන මනසින් හිතලා, අපි කවදාක්වත් මනස අසංවර කරගන්න යන්නේ නැහැ. ඒකත් අපේ ශීලයක්. බුදු රජාණන් වහන්සේ උපසම්පදා භික්ෂුවකගෙන් බලාපොරොත්තු වන ශීලයක් ඒක.

අපි කණෙන් ශබ්දයක් අහලා, ඒ ශබ්දය ගැන මනසින් හිතලා, කවදාක්වත් මනස දූෂණය කර ගන්නේ නැහැ. අපි නාසයෙන් ගඳ සුවඳක් දැනිලා, දිවෙන් රසයක් දැනිලා, ශරීරයෙන් ස්පර්ශයක් ලබලා, ඒවා ගැන මනසින් හිතලා කවදාක්වත් එයා මනස අසංවර කර ගන්නේ නැහැ. බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා යමෙක් මනස අසංවර කරගෙන ජීවත් වෙනවා නම්, ඒ අසංවර මනස තුළින් වැඩෙන්නේ අධර්මයක්මයි කියලා. ඔබ තුළ ධර්මයක් වැඩෙන්න නම් බුදු රජාණන් වහන්සේ දේශනා කළා වූ මාර්ගය වැඩෙන්න නම් අනිවාර්යයෙන්ම ඒ සිත සංවර වූ සිතක් බවට පත් වෙන්න ඕන. අසංවර වෙන්න බැහැ.

මොකද වර්තමාන සමාජය පින්වතුනි, මුළු සමාජයම බරපතල ආකාරයෙන් ආශ්වාදයන්ට කොටු වුණා වූ සමාජයක්. ඒ ආශ්වාදයට කොටු වූ සමාජය තුළයි භික්ෂූන් වහන්සේටත් ජීවත් වෙන්න වෙලා තියෙන්නේ. එතකොට මේ මාර්ගය තුළ ගමන් කරන්නා වූ බෞද්ධ ජනතාවටත් ගිහි පින්වතුන්ලාටත් ජීවත් වෙන්න සිද්ධ වෙලා තියෙන්නේ මේ අසංවර සමාජයේ මයි. ඒ නිසා ඇහෙන් රූපයක් දකිද්දී ඒ දකින රූපය මනස අසංවර කරන රූපයක් මයි, සමාජය තුළ තියෙන.

ඇඳුමෙන් පැළඳුමෙන් වේවා, කතාබහෙන් වේවා, ක්‍රියා මාර්ග යන් ගෙන් වේවා කොතැන, කොතැන බැලුවත්, හන්දියකට ගියත් අපි දකින්නේ ඇස, කණ, නාසය, දිව ශරීරය තුළින් මනස අසංවර වන ක්‍රියාවන් මයි. ඒ හේතුඵල ධර්මයක් මයි.

ඒ නිසා නිරතුරුව ම ඉන්ද්‍රිය සංවර ශීලය කියන කාරණය පැවිදි අපට විතරක් නෙවෙයි, ගිහි ඔබලාටත් අත්‍යවශ්‍ය දෙයක්, මාර්ගය ශක්තිමත් කර ගන්න. ඒක දකින කෙනා කවදාක්වත් සමාජය කොයි සා විකෘතියක් වුණත්, පින්වතුනි ඒ විකෘති සමාජය නිසා තමන් විකෘතියක් බවට පත් වෙන්නේ නැහැ. එයා සමාජයේ විකෘති භාවය දකින කොට, සමාජය දවසින් දවස ආශ්වාදයේ ගොදුරක් බවට පත් වෙනවා දකින කොට, එයා සමාජය තුළින් නිරතුරුවම අවබෝධාත්මක කලකිරීම ජීවිතයට එකතු කර ගන්නවා.

එයා දකිනවා මේ මොහොතේ සමාජය මේ සා බියකරු නම්, විෂම නම්, විකෘතියක් නම් තව අවුරුදු 25 ක් ගියාට පස්සේ මේ සමාජය කොයි සා විෂම, බියකරු, විකෘති සමාජයක් බවට පත් වෙයිද කියලා.

ඒ නිසා එයා නිරතුරුවම ඇසෙන් රූපයක් දැකලා මනස අසංවර කරගන්න යන්නේ නැහැ. කණෙන් ශබ්දයක් අහලා කවදාක්වත් ඒ ගැන හිතලා මනස අසංවර කර ගන්නේ නැහැ. එයා හැම වෙලාවෙම දක්ෂයි ඇසෙන් දකින රූපයක් ධර්මයක් කරලා දකින්න. කණෙන් අහන ශබ්දයක් ධර්මයක් කරලා දකින්න. නාසයට, දිවට, ශරීරයට දැනෙන්නා වූ දැනීමක් නිරතුරුව ධර්මයක් කරලා එයා දකිනවා.

කෙනෙක් අසංවරව හැසිරෙනවා නම්, අසංවර විදිහට ඇඳුම් පැළඳුම් අඳිනවා නම්, අසංවර දේ ප්‍රකාශ කරනවා නම්, අපි ඒ දකින්නේ මොකක්ද? එයා තිරිසන් ලෝකයේ හිත පිහිටවපු කෙනෙක්. එච්චරයි, වෙන දකින්න දෙයක් නැහැ. අද වර්තමාන සමාජයේ අප්‍රමාණ දේවල් අපට ඇහෙනවා. සමාජ ගත වෙනවා.

කෙනෙක් කියනවා සම ලිංගික සේවනය නීති ගත කළ යුතුයි කියලා. තව කෙනෙක් කියනවා ගබ්සාව නීතිගත කළ යුතුයි කියලා. නිරුවත පෙන්විය යුතුයි කියලා කියන අයත් ඉන්නවා.

## අතුරු ප්‍රශ්නය

***ගරු ස්වාමීන් වහන්ස, මෙයයි ගැටළුව. බුදු දහම ආගමක්ද? ආගමක් හැටියට මෙය හඳුන්වන සමහර උදවිය සියළුම ආගම් එක සමානයි කියලා ප්‍රකාශ කරනවා, ස්වාමීන් වහන්ස.***

එහෙයි, එහෙයි. ඒ සා මාර බලවේග සමාජය තුළ ක්‍රියාත්මක වෙනවා පින්වතුනි. එතකොට ඒවා හේතු ඵල ධර්මයන්. මොකද ඒ හේතු ඵල ධර්මයන් කියන්නේ ඒ අය මනුෂ්‍යයෝ හැටියට ඉපදුනත්, සිත පිහිටලා තියෙන්නේ සතර අපායේ. වෙන දෙයක් නෙවෙයි. මනුස්සයෝ හැටියට ඉපදුනත් සිත පිහිටුවලා තියෙන්නේ සතර අපායේ.

එක තාත්තා කෙනෙක් මට ඇවිල්ලා කියනවා "ස්වාමීන් වහන්ස, මම විදේශ ගතව ජීවත් වෙන්නේ. මගේ පුතා විදේශගතව උසස් අධ්‍යාපනය ලබනවා. මට ඉන්නේ එක දරුවයි. මගේ නෝනටයි මටයි විශාල ප්‍රශ්නයක්." මොකක්ද ප්‍රශ්නේ? "මගේ පුතා ඉහලම අධ්‍යාපනයක් ලැබුවත් එයා විවාහයක් වෙන්න කිවුවට විවාහ වෙන්නේ නැහැ. ඇයි? එයා සමලිංගික සේවනයට ඇබ්බැහි වෙලා." එතකොට මේක ගැන තාත්තට පුතාත් එක්ක කතා කරන්නත් බැහැ. අම්මාට විවෘතව කතා කරන්නත් බැහැ.

ඒ තාත්තා ඇවිල්ලා මට කියනවා "ස්වාමීන් වහන්ස, මේක පුතාත් එක්ක කතා කරන්න" කියලා. මොකද පුතා හොඳටම උගත් කෙනෙක්. පුතා කියනවා "තාත්තේ, ලෝකයේ මේ මේ රටවල් වල සමලිංගික සේවනය නීත ගත කරලා තියෙනවා" නීති ගත කරපු දෙයක්. අපේ රටෙත් ධර්මය නොදන්නා වූ දේශපාලක පින්වතුන්ලා මේවා නීති ගත කරන්න කියලා ඒ ගොල්ලෝ කියනවා. "ඉතින් කොහොමද ස්වාමීන් වහන්ස මම දරුවාට මේක කියන්නේ" කියලා අර තාත්තා අහනවා.

ඇයි, අපට කියන්න බැහැනේ දෙයියනේ මේක නීත ගත කරන්න යන දෙයක් නම් දරුවෙකුට ඒ ගැන විරුද්ධව කතා

කරන්න පුළුවන්ද? බැහැ. ඉතින් ඒ තැනට මේ ඉන්ද්‍රිය අසංවරය නිසා, ශීලයේ දුර්වල භාවය නිසා සමාජය ඒ තැනට පත්වෙලා තියෙනවා. එතකොට ඒ නිසා නිරතුරුවම සෑම මොහොතකම සමාජය තුළ අපි මේ දකින්නේ, පින්වතුනි, මාර බලයන්ගෙන් බලවත් වූ සමාජයක්. එතකොට ඒ සමාජය තුළ අපට ගැලවිලා ඉන්න ඕන නම් මේ ශීල විශුද්ධිය කියන කාරණය අත්‍යවශ්‍ය දෙයක් වෙනවා අපේ ජීවිත වලට.

## ***අතුරු ප්‍රශ්නය***

***ස්වාමීන් වහන්ස, බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද, මහා සංඝ රත්නය විසින් සුරැකිය යුතු ශීලයන් පිළිබඳව අපි නැවතත් සිහිපත් කරවමු නේද ස්වාමීන් වහන්ස.***

ප්‍රාතිමෝක්ෂ ශීලය ගැන කිවුවා. දෙවනුව ඉන්ද්‍රිය සංවර ශීලය ගැන මතක් කළා. තුන්වෙනුව බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා පින්වතුනි, අපට ලැබෙන්නා වූ සිවුපසය සිහි නුවණින් වළඳන්න කියලා. දැන් අපට ලැබෙන්නා වූ සිවුපසයක් තියෙනවානේ. මේ සිවුපසය සිහි නුවණින් වැළඳීමත් අපට තියෙන ශීලයක්.

අපට ලැබෙන දේ පිණ්ඩපාතයක් වේවා, ඖෂධයක් වේවා, චීවර වේවා, එහෙම නැත්නම් සේනාසන වේවා, මේ සෑම දෙයක්ම සිහි නුවණින් වළඳනවාය කියන කාරණයත් අපට ශීලයක් බවට පත් වෙනවා. එහෙම ප්‍රත්‍යවෙක්ෂාවෙන් පරිහරණය කරනවාය කියන කාරණයත් අපට ශීලයක් බවට පත් වෙනවා.

එතකොට ප්‍රාතිමෝක්ෂ ශීලය ගැන බුදු රජාණන් වහන්සේ අපට දේශනා කරනවා. ඊළඟට ඉන්ද්‍රිය සංවර ශීලය ගැන බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා. ඊළඟට අපට ලැබෙන්නා වූ සිවුපසය නුවණින් දැන පරිහරණය කරනවා කියන කාරණය දේශනා කරනවා.

හතර වෙනි කාරණය බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා පින්වත්නි, මිථ්‍යා ආජීවයෙන් වැලකිලා ජීවත් වෙන්න කියලා. එතකොට මිථ්‍යා ආජීවය කියන්නේ මොකක්ද?

යම් භික්ෂූන් වහන්සේ නමක් වැරදි ආජීවයන්ගෙන් ජීවත් වෙනවා නම්, ඒ කියන්නේ යන්ත්‍ර මන්ත්‍ර කරලා, එහෙම නැත්නම් ගුරුකම් කරලා, එහෙම නැත්නම් සාස්තර කියලා, එහෙම නැත්නම් බේත් හේත් කියලා, කරලා මේ කොයි ආකාරයෙන් හෝ යම් භික්ෂුවක් ජීවත් වෙනවා නම්, මුදල් හොයනවා නම් පින්වතුනි, ඒක මිච්ඡා ආජීවයෙන් ජීවත් වෙන්නා වූ ක්‍රමයක්.

මොකක්ද දෙවෙනි රථය? චිත්ත විශුද්ධිය පින්වතුනි. එයා සිතේ පිරිසිදු භාවය ඇති කරගන්නවා. සිතේ පිරිසිදු භාවය කියන්නේ මොකක්ද? මේ සිත නිරතුරුව ම අපිරිසිදු වෙලයි තියෙන්නේ පින්වතුනි. කුමක් නිසාද අපිරිසිදු වෙන්නේ? ශීලයේ දුර්වල භාවයන් නිසා. අකුසල් මූලයන්ගේ දුර්වල භාවයන් නිසා, පංච නීවරණ සහිත අපිරිසිදු සිතක් තමයි අප තුළ සකස් වෙන්නේ.

දැන් අන්න බලන්න ශීලයෙන් ශක්තිමත් කෙනා, ශීල විශුද්ධිය තුළ ශක්තිමත් කෙන,ා ඊළඟට චිත්ත විශුද්ධිය තුළ අන්න ඒ රථයට එයා නගිනවා. එයා නැගලා සිතේ පිරිසිදු භාවය ඇතිකර ගන්නවා. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ඡ කුක්කුච්ඡ විචිකිච්ඡාවන් ගෙන් එයා බැහැර වෙලා. මොකද ඔහු ශීල විශුද්ධියෙන් ශක්තිමත්, පින්වතුනි.

ශීල විශුද්ධියෙන් ශක්තිමත් වෙච්ච තැන අන්න ඉන්ද්‍රිය සංවරය ඇතිවෙනවා. ඒ ඉන්ද්‍රිය සංවරය ඇති වෙච්ච කෙනා ඇසෙන් රූපයක් දැකලා, දැක්කා වූ රූපය ගැන හිතලා, කවදාක්වත් මනස අසංවර කර ගන්නේ නෑ පින්වතුනි. ශීලයෙන් ශක්තිමත් කෙනා, ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත කෙනා කණෙන් ශබ්දයක් අහලා, ඒ ශබ්දය ගැන මනසින් හිතලා, කවදාක්වත් මනස අපිරිසිදු කර ගන්නේ නෑ. අසංවර කර ගන්නේ නෑ.

ශීලයෙන් ශක්තිමත් වෙලා, ඉන්ද්‍රිය සංවරය තියෙන කෙනා නාසයෙන් ගඳ සුවඳ දැනිලා, දිවෙන් රසයක් විඳලා, මනසින් ධර්ම රූප දැකලා, කයෙන් පහස ලබලා කවදාක්වත් මනස, හිත අසංවර කර ගන්නේ නෑ පින්වතුනි. අන්න චිත්ත විශුද්ධිය.

සිතේ පිරිසිදු භාවය ඇති කර ගන්නවා. පංච නීවරණ යටපත් කර ගන්නවා. පංච නීවරණ යටපත් කර ගනිමින් පින්වතුනි, නිරතුරුව සමාධිගත සිතක් එයා ඇතිකර ගන්නවා. ධ්‍යානගත සිතක් ඇති කර ගන්නවා.

දැන් ධ්‍යාන ගත සිතක්, සමාධි ගත සිතක් ඇති වුණේ කුමක් නිසාද? එයා දෙවෙනි අශ්ව රථයට නැගලා ඉන්නේ පින්වතුනි. එතකොට එයා දෙවෙනි අශ්ව රථයට නැග්ගේ කොහොමද? පලවෙනි අශ්ව රථයේදී ශීලයේ පිරිසිදු භාවය එයා ශක්තිමත් කර ගත්තා. ශීලයේ පිරිසිදු භාවය ශක්තිමත් කළා.

ඒ රථයෙන් දැන් එයා බහිනවා. දෙවනුව දැන් චිත්ත විශුද්ධිය කියන රථයට නැගලා පින්වතුනි නිරතුරුව එයා සීලය විසින් සකස් කර දුන්න ඉන්ද්‍රිය සංවරය ප්‍රයෝජනයට අරගෙන පින්වතුනි, එයා සමාධිගත සිතක් ඇතිකර ගන්නවා. ඇලීම්, ගැටීම් දෙක අතරේ එයා දෝලනය වෙන්න යන්නේ නෑ පින්වතුනි. නිරතුරුව උපේක්ෂාව තුළ එයා ශක්තිමත් කෙනෙක් බවට පත් වෙනවා. අන්න දැන් චිත්ත විශුද්ධිය එයාගෙන් ශක්තිමත්.

දැන් ඔබ මට ප්‍රශ්නයක් යොමු කළා. මොකක්ද ඒ ප්‍රශ්නය? සප්ත විශුද්ධීන් තුළ ආර්ය අෂ්ටාංගික මාර්ගය මතුකරලා දක්වන්නේ කොහොමද කියලා.

එහෙම නම් පින්වතුනි මෙන්න මේ සප්ත විශුද්ධි ධර්මයන් ගෙන් ඔබ ශීල විශුද්ධිය චිත්ත විශුද්ධිය කියන තැනට එද්දි මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගයම ඔබ තුළින් වැඩිලා, පින්වතුනි. මුළු ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගයම ඔබ තුළින් වැඩිලා.

කොහොමද වැඩුනේ? බුදුරජාණන් වහන්සේ ශීලයට අදාල අංග තුනක් කියනවා. සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ. දැන් ඔබ ශීල විශුද්ධියේදී මේ අංග තුන සම්පූර්ණයි පින්වතුනි.

ඊළඟට ඔබ චිත්ත විශුද්ධියට එනවා. චිත්ත විශුද්ධියේදී සමාධියට අදාල අංග තුනක් තියෙනවා. සම්මා වායාමෝ, සම්මා සති, සම්මා සමාධි පින්වතුනි. එහෙනම් චිත්ත විශුද්ධියේදී මෙන්න මේ අංග තුනම ඔබ තුළ වැඩිලා. එහෙම නම් ඔබ ශීල විශුද්ධිය තුළ අංග තුනක් වැඩුවා. චිත්ත විශුද්ධිය තුළ අංග තුනක් වැඩුනා.

මුල් අංග දෙක වැඩිලා ඉවරයි, පින්වතුනි ඔබ තුළ. සම්මා දිට්ඨි සම්මා සංකප්පයන්. ලෞකික ප්‍රඥාව වඩාගෙනයි ඔබ ශීල විශුද්ධිය කියන රථයට ගොඩ වුණේ. ඔබ තුළ ලෞකික ප්‍රඥාව නැත්නම්, සම්මා දිට්ඨියේ අර්ථයන් ඔබ හඳුනන්නේ නැත්නම් කවදාක්වත් ඔබ ශීල විශුද්ධියට එන්නේ නෑ පින්වතුනි. ඒ නිසා ශීල විශුද්ධිය කියන රථයට ඔබ නැග්ගේ සම්මා දිට්ඨි සම්මා සංකප්ප කියන ලෞකික ප්‍රඥාවට අදාල මාර්ගය ඔබ තුළ වැඩුණ නිසාමයි.

එහෙම නම් ඔබ යොමු කරපු ප්‍රශ්නය වුනේ මොකක්ද? මේ සප්ත විශුද්ධීන් තුළ ආර්ය අෂ්ටාංගික මාර්ගය දක්වන්න කියලා. එහෙනම් මේ ශීල විශුද්ධියත් චිත්ත විශුද්ධියත් කියන තැන ඔබ ශක්තිමත් වෙද්දි ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය පරිපූර්ණ වශයෙන් ඔබ තුළ වැඩිලා පින්වතුනි.

මින් ඉදිරියට වැඩෙන්නේ ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය.

එහෙනම් දැන් බලන්න අර සාකේත නුවරට යන්න කොසොල් රජතුමා පලමුවෙනි අශ්ව රථයට නැග්ගා. ශීල විශුද්ධිය කියන තැනට. දෙවන අශ්ව රථයට නැග්ගා. අන්න නිවන් මාර්ගය තුළ ගමන් කරන පින්වතා ශීල විශුද්ධිය කියන රථයෙන් බැහැලා අන්න එයා දැන් චිත්ත විශුද්ධිය කියන රථයෙන් සම්පූර්ණ කර

ගත්තා. ඒ ගමන් මග සම්පූර්ණ කර ගත්තා, පින්වතුනි.

ඊළඟට එයා චිත්ත විශුද්ධිය කියන රථයෙන් බැහැලා මොකද කරන්නේ? දිට්ඨි විශුද්ධිය කියන තුන්වන රථයට එයා ගොඩ වෙනවා. තුන්වෙනි රථයට.

එතකොට දිට්ඨි විශුද්ධිය කියලා කියන්නේ මොකක්ද පින්වත්නි. දෘෂ්ඨිය, දැක්ම එයා නිවැරදි කර ගන්නවා. දැක්ම නිවැරදි කර ගන්නවා. මොකද තාමත් අපට අපේ දැක්ම නිවැරදි කරගන්න බැරි වුණේ කුමක් නිසාද? ඊට අදාළ චිත්ත විශුද්ධිය අප තුළ නෑ පින්වතුනි. විසිරුනා වූ හිතක් අපට තියෙන්නේ. උපේක්‍ෂා සහගත හිතක් අපට තවම නැහැ. නිරතුරුවම සමාජය තුළ හේතුඵල ධර්මයන් විසින් නිර්මාණය කරන්නා වූ සිදුවීම් නිසාම අපි, ඇලීම් ගැටීම් දෙක දිසාවට දෝලනය වෙමින් තමයි ගමන් කරන්නේ.

ඒ නිසාම පින්වතුනි, අපේ දැක්ම ධර්මානුකූලව නිවැරදි කරන්න අපට තාම පුළුවන්කමක් ලැබිලා නැහැ. දැන් එයා ශීල විශුද්ධියෙන් ශක්තිමත්. ඊළඟට එයා චිත්ත විශුද්ධියෙන් ශක්තිමත්. එයාට පංච නීවරණ තුනී වුනා වූ සුන්දර උපේක්‍ෂා සහගත සිතක් තියෙනවා. ඒ උපේක්‍ෂා සහගත සිතෙන් අන්න තුන්වෙනි අශ්ව රථයට නැගලා එයා දිට්ඨි විශුද්ධිය ශක්තිමත් කර ගන්නවා.

ඒ කියන්නේ එයා දැක්ම නිවැරදි කර ගන්නවා. මොකක්ද දැක්ම නිවැරදි කරන්නේ? අපි සෑම මොහොතකම පින්වතුනි පංච නීවරණයන් නිසාම, ශීලයේ දුර්වල භාවයන් නිසාම වැරදි දැක්මක් තුළයි ඉන්නේ. තමා තුළ තමා දකිනවා. තමා තුළ ආත්මයක් දකිනවා. තමා තුළ මම කියලා සත්ත්වයෙක් පුද්ගලයෙක් දකිනවා. මේ මම භවයෙන් භවයට යනවාය කියලා දකිනවා. මේ ඇස තුළ මම ඉන්නවා කියලා දකිනවා. ඇස තුළ මගේ ආත්මය තියෙනවා කියලා දකිනවා. ඒ ආත්මය තුළ මම ඉන්නවාය කියලා දකිනවා.

මේ රූපය මමය කියලා දකිනවා. මේ රූපය තුළ මගේ ආත්මය තියෙනවා කියලා දකිනවා. ඒ ආත්මය භවයෙන් භවයට,

භවයෙන් භවයට ගමන් කරනවා කියලා දකිනවා. නිරතුරුවම ආත්ම දෘෂ්ඨියෙන් වෙළිලා අපි ජීවත් වෙනවා පින්වතුනි.

මගේ අම්මා, තාත්තා තුළ මම ඉන්නවා කියලා දකිනවා. මගේ බිරිඳ, ස්වාමි පුරුෂයා තුළ මම ඉන්නවාය කියලා දකිනවා. මා තුළ මගේ බිරිඳගේ, ස්වාමි පුරුෂයාගේ ආත්මය තියෙනවා කියලා දකිනවා. මගේ දරුවා තුළ, මගේ මුණුබුරා, මිණිබිරී තුළ මගේ ආත්මය තියෙනවා කියලා දකිනවා. මේ දරුවා සදාකාලිකව ම මගේය කියලා දකිනවා පින්වතුනි.

අන්න ආත්ම දෘෂ්ඨිය දැඩි කර ගන්නවා. දැඩි කර ගන්න මොහොතක් පාසා පින්වතුනි, අපි නැවත, නැවත, නැවත, නැවත සක්කාය දිට්ඨිය ශක්තිමත් කරගන්න දිශාවකටමයි ගමන් කරන්නේ.

දැන් තමන්ගේ චිත්ත විශුද්ධිය ශක්තිමත්. සුන්දර උපේක්ෂා සහගත සිතක් තියෙනවා. ඇලීම් ගැටීම් වලට යන්නේ නෑ. සමාජය කොයි සා දරුණු වුණත් සමාජය කොයි සා සංකීර්ණ වුනත් ඒ සෑම දෙයක් ම තමන් හේතු ඵල ධර්මයන් හැටියට දකිනවා. තමන් ඉදිරියට එන සැප වේදනාවත් හේතුවක් හැටියට ඵලයක් හැටියට දකිනවා. තමන් ඉදිරියට එන දුක් වේදනාවත් හේතුඵල ධර්මයක් හැටියට දකිනවා.

තමන් අසතුටු දෙයක් සිද්ධ වෙන්නේ තමන් සංසාරයේ කළා වූ අකුසලයක් නිසාමයි කියලා එයා දකිනවා පින්වතුනි. එයා දැකලා උපේක්ෂා සහගත සිතෙන් අන්න දැක්ම පිරිසිදු භාවයට පත් වෙනවා. කොහොමද එයා දැක්ම පිරිසිදු භාවයට පත් වෙන්නේ?.

එයා පටිච්ච සමුප්පාදයට අදාලව හිතනවා හේතුඵල ධර්මයන්ට අදාලව හිතනවා. ආත්මීය දෘෂ්ඨිය තුළ එයා ශක්තිමත් වෙන්නේ නෑ, බැස ගන්නේ නෑ පින්වතුනි. එයා දකිනවා අවිද්‍යාව තියෙන තාක් කල් අන්න සංස්කාර රැස් වෙනවා. මොකක්ද අවිද්‍යාව කියන්නේ? අපි චතුරාර්ය සත්‍යය දන්නේ නෑ. දුක කියන කාරණය අපි තවම අවබෝධ කළේ නෑ. දුකට හේතුව තෘෂ්ණාව කියන කාරණය අපි තවම අවබෝධ කළේ නෑ. දුක නැති කරන්න

නම් තෘෂ්ණාව නැති කරන්න ඕනේ කියන කාරණය තවම අපි අවබෝධ කලේ නෑ. දුක නැති කිරීමේ, තෘෂ්ණාව නැති කිරීමේ මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගයයි කියලා තවම අපි අවබෝධ කලේ නෑ පින්වතුනි. අන්න අවිද්‍යාව තුළ අපි ඉන්නවා.

ඒ අවිද්‍යාව නිසාම අපි මොකද කරන්නේ? නිරතුරුව "අවිද්‍යා පච්චයා සංඛාරා," සංස්කාර රැස් කරනවා. නිරතුරුව අපි කුසල් සංස්කාර රැස් කරනවා. අකුසල් සංස්කාරයන් රැස් කරනවා. ඒ රැස්කරන නිසාම පින්වතුනි 'සංස්කාර පච්චයා විඤ්ඤාණං', ඊට අදාල කර්ම ශක්තිය අප තුළ සකස් වෙනවා. ඒ කර්ම ශක්තිය නිසාම විඤ්ඤාණය නිසාම, දැනීම් නිසාම" විඤ්ඤාණ පච්චයා නාම රූපං නිරතුරුව පින්වත්නි භවයෙන් භවයට, භවයෙන් භවයට අපි පටිච්ච සමුප්පන්නව ගලාගෙන යනවා.

ඒ නිසා මෙයා පටිච්ච සමුප්පාදයට අදාලව දකිනවා. එයා ඇස් දෙක පියාගෙන දකින්න දක්ෂයි. 'සංස්කාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාම රූපං' කියන ධර්මතාවය එයා ධර්මානුකූලව නුවණින් දකිනවා.

එයා දකිනවා පෙර ජීවිතයේ තමා මනුස්සයෙක් නම් ඒ මනුස්ස ජීවිතයේ මැරෙන වෙලාවේ සකස් වෙන්නා වූ චුති සිතක් තියෙනවා. ඒ චුති සිත කියන්නේ අවසාන පංචුපාදානස්කන්ධයයි පින්වත්නි. මේ අවසාන චුති සිත තමයි ප්‍රතිසන්ධි චිත්තය හැටියට අනිත්‍ය භාවයට පත් වී නැවත ඕපපාතිකව නැත්නම් මව් කුසකට නැත්නම් බිත්තරයකට බැස ගන්නේ.

ඒ බැස ගන්න මොහොතේ පටන් 'විඤ්ඤාණ පච්චයා නාමරූපං' නැවත නාම රූප ධර්මයන් සකස් වෙනවා. ඒ නාම රූප ධර්මයන් නිසා ආයතන හය සකස් වෙනවා. ආයතන හය නිසා නැවත ස්පර්ශය සකස් වෙනවා. 'ඵස්ස පච්චයා වේදනා' අන්න ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන්, නැවත අපි පංච උපාදානස්ක්ධය ගොඩ නගා ගන්නවා. 'වේදනා පච්චයා තණ්හා' 'තණ්හා පච්චයා

උපාදානං', බැඳී යාම් ඇති කර ගන්නවා. ඒ ''උපාදාන පච්චයා භවෝ'', කාම භව, රූපී භව අරූපී භව භවාත්‍රය තුළ අපි උපතක් සකස් කර ගන්නවා.

'භව පච්චයා ජාති' අන්න නැවත ඉපදෙනවා. 'ජාති පච්චයා ජරා මරණං, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස උපායාසා.' අන්න පින්වතුනි හේතුඵල ධර්මයන් දකිනවා.

මේක හේතූන් නිසා සකස් වුනා වූ ඵලයක්. අවිද්‍යාව නිසාමයි සංස්කාර සකස් වෙන්නේ. 'අවිද්‍යා නිරෝධා සංස්කාර නිරෝධෝ' පින්වතුනි. සංස්කාර නිසාමයි විඤ්ඤාණය සකස් වෙන්නේ. 'සංස්කාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ'. අවිද්‍යාව නිසාමයි ජාති, ජරා, ව්‍යාධි, මරණය සකස් වෙන්නේ. අවිද්‍යාව නිරෝධය කරපු තැනදි ජාති, ජරා, ව්‍යාධි, මරණින් නිරෝධය වෙලා යනවා.

අන්න පටිච්ච සමුප්පන්නව එයා දකිනවා. එයා මෙතන සත්ත්වයෙක් පුද්ගලයෙක් දකින්නේ නෑ. එයා මෙතෙන ආත්මීය දෙයක්, මගේ කරගන්න කියලා දෙයක් දකින්නේ නෑ. එයා දකිනවා මේ සියල්ලක්ම පටිච්ච සමුප්පන්නව සාංසාරිකව තෘෂ්ණාව නිසාම ගොඩනැගෙන්නා වූ දේවල් කියලා පින්වතුනි. අන්න දැක්ම පිරිසිදු භාවයට පත් කර ගත්තා.

එයා තමාගේ ඇස තුළ ආත්මය බැසගෙන තියෙනවා. ඒ ආත්මය තුළ මම ඉන්නවා කියලා දකින්නේ නෑ. එයා තමාගේ අම්මා තාත්තා තුළ තමාගේ ආත්මය තියෙනවා. ඒ අම්මා, තාත්තා තුළ මගේ ආත්මය තියෙනවා. ඒ අම්මා මගේමයි කියලා එයා දකින්නේ නෑ. එයා අම්මාත් පටිච්ච සමුප්පන්න උපතක් කියලා එයා දකිනවා. ඒ වගේම තමන්ගේ බිරිඳ, දරුවා, එහෙම නැත්නම් ස්වාමි පුරුෂයා මේ සෑම දෙයක්ම පින්වතුනි පටිච්ච සමුප්පන්නව එයා දකින්න දක්ෂ වෙනවා.

ඒ දැක්ම තුළ සක්කාය දිට්ඨිය එයා තව තව තුනී කර ගන්නවා පින්වතුනි. අන්න එයා දැක්මෙන් නිවැරදි භාවයට පත්වුණා. දැන් එයා ශීල විශුද්ධිය කියන රථයෙන් ගොඩ වෙලා බැස්සා. චිත්ත

විශුද්ධියට ගොඩ වුණා. එයා ඉන්ද්‍රිය සංවරය ඇතිකර ගත්තා. සමාධිමත් සිතක් ඇතිකර ගත්තා. ඒ වෙනකොට එයා ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය සම්පූර්ණ කරලයි තියෙන්නේ.

දැන් එයා ලෞකික ආර්ය අෂ්ටාංගික මාර්ගය විදර්ශනා නුවණින් දකින තැනටයි ඇවිල්ලා ඉන්නේ පින්වතුනි. අන්න දිට්ඨි විශුද්ධිය තුළ ශක්තිමත්. එයා ආත්මීය භාවයක්, මමය කියලා දැක්මක්, දකින්නේ නෑ. හේතු ඵල ධර්මයන් තුළ දකිනවා.

එයා දෑස් පියාගෙන දකිනවා, මේ මොහොතේ මනුස්සයෙක් වෙලා හේතූන් නිසා උත්පත්තියන් ලැබුවත්, තමන් මරණාසන්න මොහොතේ චුති සිතට අකුසලයක් උපාදානය වුණොත්, මම ඊළඟ ජීවිතයේ පටිච්ච සමුප්පන්නව තිරිසනෙක් වෙනවා කියලා දකිනවා. තමන් මරණාසන්න මොහොතේ තමන්ට කුසල් සිතක් ඇති වුනොත්, තමන් ඊළඟ ජීවිතයේ සුන්දර දෙවියෙක් වෙනවා කියලා එයා දකිනවා.

එහෙනම් මේ ජීවිතය මගේය මමය කියලා එයා ගන්නේ නෑ. මේක මගේ වසඟයේ තබාගන්න පුළුවන් මනුස්ස ජීවිතයක්, මේ අම්මා මගේ වසඟයේ තබා ගන්න පුළුවන් අම්මා කෙනෙක්, මේ ස්වාමි පුරුෂයා මගේ වසඟයේ තබා ගන්න පුළුවන් ස්වාමි පුරුෂයෙක්. මේ දරුවා, මේ මුණුබුරා මේ මිණිබිරී මගේ වසඟයේ තබා ගන්න පුළුවන් රූපයක් කියලා එයා දකින්නේ නෑ. පටිච්ච සමුප්පන්නව හේතු ඵල ධර්මයන්ට අදාලව දීර්ඝ භව ගමනක් යන සත්ත්වයෙක් හැටියටයි පටිච්ච සමුප්පන්නව දකින්නේ. දිට්ඨිය පිරිසිදුයි. මමත්වයේ දැඩි භාවය එයා ඇති කර ගන්නේ නෑ.

දැන් දිට්ඨි විශුද්ධිය නමැති රථයට නැග්ගා. ඒ රථය තුළ ශක්තිමත් වෙලා දැන් එයා කංඛාවිතරණ විශුද්ධිය කියන වාහනයට නගිනවා පින්වතුනි. කංඛාවිතරණ විශුද්ධිය කියන වාහනයට නගිනවා. එයා කංඛාවිතරණ විශුද්ධිය කියන වාහනයට නැගලා නිරතුරුව එයා දැන් රූපයේ අනිත්‍යය භාවය දකිනවා. එයා රූපයේ අනිත්‍ය භාවය දකිනවා. එයා ඇසේ, කණේ, නාසයේ, දිවේ, ශරීරයේ,

මනසේ අනිත්‍ය භාවය දකිනවා. එයා ආයතන හැටියට රූපයේ අනිත්‍ය භාවය දකිනවා. දෙතිස් කුණපයක් හැටියට එයා රූපයේ අනිත්‍යය දකිනවා. සතර මහා ධාතුවක් හැටියට එයා ඒ රූපයේ අනිත්‍යය දකිනවා. මරණානුස්සතියක් හැටියට එයා රූපයේ අනිත්‍ය භාවය දකිනවා. අට්ඨික සංඥාවක් හැටියට එයා රූපයේ අනිත්‍යය දකිනවා. කංඛාවිතරණ විශුද්ධිය.

අනිත්‍ය දැක්මක් දැක්කත් පින්වතුනි එයා උපක්ලේශයන් හඳුනා ගත්ත කෙනෙක් නෙවෙයි. කංඛාවිතරණ විශුද්ධියේ තියෙන ලක්ෂණය තමයි එයා රූපයේ අනිත්‍යභාවය දකිනවා; එයා පංචුපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිනවා; එයා කායානුපස්සනාව, ධම්මානුපස්සනාව, චිත්තානුපස්සනාව වඩනවා; වැඩුවත් උපක්ලේශයන්ගේ ගොදුරක් බවට එයා තවම පත්වෙලා තියෙනවා පින්වතුනි.

ඒ කියන්නේ නිරතුරුව එයා භාවනා කරද්දි එයාට ආලෝක සංඥාවක් දැනෙනවා. එයා ආලෝක සංඥාවට බැඳෙනවා පින්වතුනි. ඒ ආලෝකය අනිත්‍ය වූ රූපයක් කියලා දැකලා, විදර්ශනාත්මකව දැක ගන්න එයා තාම දක්ෂ නෑ. එයා භාවනා කරනවා. එයාට අමනුස්ස රූපයක් පෙනෙනවා. අන්න අමනුස්ස රූපයට ගැටෙනවා. ඒක උපක්ලේශයක් කියලා එයා දකින්නේ නෑ, පින්වතුනි.

එයා භාවනා කරනවා. එයාට සුන්දර දෙවියෙක් පෙනෙනවා. අන්න ඒ දෙවියාට ඇලෙනවා. විදර්ශනාවෙන් බැහැර වෙනවා. දෙවියා කියන්නෙත් රූපයක්; රූපය අනිත්‍යයි; කියලා දකින්න තවම එයාට බැහැ. උපක්ලේශයන්ට භාවනාවේ ආශ්වාදයන්ට තවම එයා රැවටෙනවා, පින්වතුනි.

ඒ වගේම සමහර පින්වතුන්ලා අපිට ඇවිල්ලා කියනවා "ස්වාමීන් වහන්ස, මම භාවනා කරද්දි මාව එක පාරටම උඩ ගියා" කියලා. එයා උඩ ගියේ නැහැ. එයා හිටියේ බිම මයි. උඩ යනවා කියලා හිතක් සකස් වුනා. ඒ හිත අනිත්‍යයි කියලා දැක්කේ නෑ.

මොකද උපක්ලේශයන්ට කොටුවීම කංඛාවිතරණ විශුද්ධියේ තියෙන ලක්ෂණයක් පින්වතුනි. අනිත්‍යය වැඩුවත් නිරතුරුව සමථ, විදර්ශනාවේදී සකස් වන උපක්ලේශයන්ගේ ගොදුරක් බවට එයා පත් වෙනවා. මේ කාරණය වර්තමාන සමාජයේ බලවත් ආකාරයෙන් තියෙනවා.

භාවනාව කරන්න යන සෑම කෙනෙක්ම පින්වතුනි කුමක් හෝ ආශ්වාදයක් තුළට කොටු වෙනවා. එයා ආශ්වාදය අනිත්‍යයි කියලා දකින්න දක්ෂ නෑ. ඒ ඇලීම ගැටීම චිත්තානුපස්සනාවට දාලා, වේදනානුපස්සනාවට දාලා, ධම්මානුපස්සනාවට දාලා, ඒ හිත අනිත්‍යයි කියලා දකින්න දක්ෂ නෑ. භාවනා කරද්දි පින්වතුනි ආශ්වාදයක් සකස් වෙච්ච තැන එක්කෝ ආශ්වාදයට ඇලෙනවා. එක්කෝ ගැටෙනවා. ඇයි ආශ්වාදයට ඇලෙන්නේ? ඇයි ආශ්වාදයට ගැටෙන්නේ?

ඒ මොහොතේ එයා චිත්තානුප්සනාව තුළ හිටියේ නෑ. ඒ මොහොතේ එයා වේදනානුපස්සනාව තුළ හිටියේ නෑ. ඒ මොහොතේ කායානුපස්සනාව තුළ හිටියේ නෑ. එයා කායානුපස්සනාව තුළ හිටිය නම්, එයා භාවනා කරද්දි දෙවියෙක් දැක්කොත්, දෙවියාව එයා අට්ඨික සංඥාවෙන් දකිනවා පින්වතුනි. භාවනා කරද්දි එයාට අමනුස්ස රූපයක් පෙනුනොත් එයා ඒ අමනුස්ස රූපය මරණානුස්සතියක්, අට්ඨික සංඥාවක් හැටියට දකිනවා. එයා භාවනා කරන වෙලාවේ එයාට සුන්දර දිව්‍යංග නාවක් පෙනුණොත් ඒ සුන්දර දිව්‍යාංගනාව දෙතිස් කුණපයක් හැටියට එයා දකින්න දක්ෂයි. මොකද එයා උපක්ලේශයන් ජය ගත්ත කෙනෙක් නම්.

නමුත් මේ කංඛාවිතරණ විශුද්ධියේදී පින්වතුනි එයා අනිත්‍යය වඩනවා. නමුත් උපක්ලේශයන්ගේ ගොදුරක් බවටයි එයා පත්වෙන්නේ. එයා ආලෝක සංඥාවන් සොයාගෙන භාවනා කරනවා. එයාට අවශ්‍ය ආලෝක සංඥාවක් දැකීමක්. සමහරු ඉන්නවා දෙවියන් දකින්න භාවනා කරනවා. සමහරු දිව්‍ය ලෝක දකින්න භාවනා කරනවා. සමහරු උඩ යන්න, පාවෙන්න,

නොදැනී යනවා දකින්න ප්‍රාර්ථනා කරමින් භාවනා කරනවා. මේ සෑම දෙයක්ම කංඛාවිතරණ විශුද්ධියේ ලක්ෂණයි පින්වතුනි. ඒ නිසා දැන් එයා ශීල විශුද්ධියෙන් ශක්තිමත්. චිත්ත විශුද්ධියෙන් ශක්තිමත්. දිට්ඨි විශුද්ධියෙන් ශක්තිමත්. කංඛාවිතරණ විශුද්ධියේදී එයා සුන්දර අනිත්‍ය දැක්කා වුණත්, උපක්ලේශයන් විසින් එයාව ගොදුරු කර ගන්නවා පින්වතුනි.

දැන් එයා අනිත්‍යය දකිමින් කංඛාවිතරණ විශුද්ධිය කියන රථයට නැගලා එම රථයෙන් බහිනවා පින්වතුනි. බැහැලා එයා නගින පස්වෙනි රථය තමයි මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය නම් වූ රථය.

මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය කියන්නේ එයා මාර්ගය හඳුනා ගැනීමේ ඥාණය ඇතිකර ගත්තා. **දැන් මම මේ කියන්නේ කෙනෙකුට උතුම් රහත් ඵලය දක්වා යන මාර්ගය. ගිහි පින්වතුන්ලාට උතුම් සෝවාන් ඵලය සාක්ෂාත් කර ගන්න අවශ්‍ය නම් මේ මාර්ගය අනිවාර්යෙන්ම වැඩෙන්න ඕනේ. එහෙම නැතුව සෝවාන් ඵලය සාක්ෂාත් වීමක් නෑ.** එයා කංඛාවිතරණ විශුද්ධිය කියන වාහනයෙන් බැස්සා.

මෙතෙක් එයා අනිත්‍යය වැඩුවා. නමුත් උපක්ලේශයන් වලට රැවටිලායි සිටින්නේ.

අන්න දැන් පින්වතුනි එයා කංඛාවිතරණ විශුද්ධියෙන් පස්සේ මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය කියන රථයට නගිනවා. එයා මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය කියන රථයට නැග්ගාය කියන්නේ අන්න පින්වතුනි සුන්දර වූ තැන. මේ ධර්ම මාර්ගයේ මේ නිවන් මාර්ගයේ, මේ විදර්ශනාත්මක මාර්ගය තුළ තියෙන සුන්දරම තැන තමයි පින්වතුනි මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධියයි කියන්නේ. ඒ කියන්නේ එයා මාර්ගය හඳුනා ගත්තා පින්වතුනි. එයා මාර්ගය දැන් හඳුනා ගත්තා.

ආයිමත් එයාව පංච උපාදානස්කන්ධ මාරයාට රවට්ටන්න බෑ පින්වත්නි. එයා දැන් අනිත්‍යය වඩමින් උපක්ලේශයන්

හඳුනා ගත්ත කෙනෙක් බවට පත්වෙනවා. එයා දකිනවා මේ උපක්ලේශයන් කියන්නේ අනිත්‍ය වූ සිතක් පමණක්මයි කියලා. මේ උපක්ලේශයන් කියන්නේ අනිත්‍ය වූ රූපයන් පමණක්මයි කියලා එයා දකිනවා. දැකලා එයා දැන් කායානුපස්සනාව තුළ දැන් ශක්තිමත් වෙනවා.

එයා තමන්ගේ රූපය දෙතිස් කුණපයක් හැටියට දකිනවා. තමන්ගේ රූපය සතර මහා ධාතුවක් හැටියට එයා දකිනවා. තමන්ගේ රූපය ආයතන හයක් හැටියට එයා දකිනවා. තමන්ගේ රූපය නිරතුරුවම අනිත්‍ය වන ඉරියව් පවත්වන කයක් හැටියට එයා දකිනවා. තමන්ගේ රූපය මරණානුස්සතියක් හැටියට එයා දකිනවා පින්වතුනි.

බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා සතර සතිපට්ඨාන සූත්‍රයේ දී, කායානුපස්සනාවට අදාලව පින්වතුනි, සුන්දර අනිත්‍ය වඩන්නා වූ ක්‍රම වේදයන්. එතනදී බුදු රජාණන් වහන්සේ මරණානුස්සතිය අපි සෑම කෙනෙකුටම සුන්දර වූ කායානුපස්සනාව ශක්තිමත් කරලා දෙන ධර්මතාවයක්. බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා තමාගේ මේ සුන්දරයි කියලා දකින රූපය, මේ මගේ කරගෙන පෝෂණය කරන මගේ කරගෙන, උපාදානය කරගෙන, මේ රූපය රකින්න සිල්පද බිඳගෙන අකුසල් මූලයන් වඩමින් මේ මහා විකාරයක් කරන මේ රූපය පින්වතුනි මරණානුස්සතියක් හැටියට දකින්න කියලා.

මරණානුස්සතිය තුළින් රාග සිත දමනය වෙලා යනවා පින්වතුනි, ලෝභ සිත දමනය වෙලා යනවා. මෝහ සිත දමනය වෙලා යනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා තමන්ගේ මේ රූපය මළ සිරුරක් කරලා දකින්න කියලා. ඒ මළ සිරුර සුසාන භූමියකට ගිහිල්ලා දාලා තියෙනවා දකින්න කියනවා. ඒ මළ සිරුර පළමුවෙනි දවස වෙනකොට නිල් පාට වෙලා ඉදිමිලා තියෙනවා නුවණින් දකින්න කියනවා. ඒ නිල් පාට වෙලා ඉදිමිලා තියෙන ඒ මළ සිරුර මේ ඇසෙන්, කණෙන්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන් ඕජාව ගලනවා නුවණින් දකින්න කියනවා.

ඒ ඕජාවට වහ වැටුණා වූ නිල මැස්සෝ මේ මල සිරුර පුරා සුන්දර ආහාරයක් සේ මේ මළ සිරුරේ ඕජාව භුක්ති විඳිනවා දකින්න කියනවා.

ඊලඟට තිරිසන් සතුන් ඇවිල්ලා, බල්ලන් ඇවිල්ලා, කබර ගොයින් ඇවිල්ලා, නරියන් ඇවිල්ලා මේ මළ සිරුර කෑලි, කෑලි කෑලි කඩාගෙන කනවා නුවණින් දකින්න කියනවා. ජීවත්ව සිටියදී ඔබේ මේ සුන්දර රූපය ඔබ සුන්දර ආකාරයෙන් භුක්ති වින්දා වගේ මැරුණාට පස්සේ තිරිසන් සතුන් සතුටින් ඔබේ මල සිරුර භුක්ති විඳිනවා නුවණින් දකින්න කියනවා. මේ ඇස කඩාගෙන කනවා නුවණින් දකින්න කියනවා. මේ නාසය, මේ ශරීරය, මේ දිව, මේ ඇස කෑලි කෑලිවලට කඩමින් කුණු මස් කනවා නුවණින් දකින්න කියනවා පින්වතුනි.

මෙහෙම දකින මෙහොතක් පාසා පින්වතුනි, රාග සිත තුනී වෙලා යනවා. රාග සිත මරා දානවා. ලෝබ සිත මරා දානවා. රූපය කෙරෙහි තියෙන ආශ්වාදය තුනී කරලා දානවා. නිරතුරුව තමන් මගේ කරගෙන මේ දරාගෙන ඉන්නේ කුණු වීමට අයිති රූපයක් කියලා එයා දකිනවා. නිල මැස්සන්ට අයිති රූපයක් කියලා එයා දකිනවා. ඕජාවට කුණුවීමට අයිති රූපයක් කියලා එයා දකිනවා. තිරිසන් සතුන්ට ආහාරයක්ය කියලා එයා දකිනවා.

ඒ සෑම දෙයක්ම එයා දකිමින් තමාගේ මල සිරුර පින්වතුනි අට්ඨික සංඥාවක් කරලා එයා දකිනවා. මස් ටික කඩාගෙන කෑවට පස්සේ ඇට සැකිල්ලයි ඉතුරු වෙන්නේ. අපි වනවාසීව ජීවත් වෙද්දී අපි දකිනවා කැලේ සත්තු මැරෙනවා. හරක් මැරෙනවා, වෙන වෙන සත්තු මැරෙනවා. දවසයි, දෙකයි, තුනයි පින්වතුනි, සම්පූර්ණයෙන්ම මස කාලා ඉවරයි. ඇටකටු කෑලි ටික තියෙනවා. ඒ ඇටකටු කෑලි ටිකත් ඔන්න සුමානයක් විතර යනකම් තැන් තැන් වලට අරන් ගිහිල්ලා සූප්පු කරලා ඒකත් අයින් කරලා දානවා. ඊට පස්සේ ඒ ඇටකටු කෑලි ටිකත් මහ පොළොවේ සතර මහා ධාතුවටම එකතු වෙනවා. බාහිර සතර මහා ධාතුවටම එකතු වෙනවා, පින්වතුනි.

අන්න එයා මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධියේදී සුන්දර කායානුප්සසනාව දකිනවා. ඒ සුන්දර කායානුපස්සනාව දකින ගමන් සුන්දර වේදනානුපස්සනාව තුළ ශක්තිමත් වෙනවා. එයා සකස් වෙන සෑම සැප වේදනාවක්ම අනිත්‍යයි කියලා දකිනවා. එයා සැප වේදනාවට බැඳෙන්නේ නෑ. එයා දකිනවා සංසාරේ මම සක්විති රජ වෙලා හිටියා කියලා පටිච්ච සමුප්පන්නව. ඒ සැප වේදනාව අනිත්‍ය වෙලා ගියා.

එයා දකිනවා සංසාරේ මම ශක්‍රයා වෙලා හිටියා කියලා, පටිච්ච සමුප්පන්නව. ඒ සැප වේදනාවත් අනිත්‍ය වෙලා ගියා. සංසාරයේ මම සුජම්පතිය වෙලා හිටියා. ඒ සැප වේදනාවත් අනිත්‍ය වුණා. මේ ජීවිතයේ ළමා කාලේ, තරුණ කාලේ සුන්දර රූපයක අයිතිකාරයෙක් වෙලා හිටියා. සුන්දර කට හඬක අයිතිකාරයෙක් වෙලා හිටියා. ඒ සෑම දෙයක්ම අනිත්‍ය වෙලා ගියා. ඒ නිසා එයා සකස් වෙන සැප වේදනාවට බැඳෙන්නේ නෑ. සැප වේදනාව අනිත්‍යයි කියලා දකිනවා. එයා තමා තුළ සකස් වෙන දුක් වේදනාවට බැඳෙන්නේ නෑ. එයා දකිනවා මේ ජීවිතයේ කොච්චර නම් දුක් වේදනා මට ඇති වෙන්න ඇත්ද?

පුංචි කාලේ ඉඳන් අම්මා නිසා, තාත්තා නිසා, සමාජය නිසා ඇති වූ ඒ සෑම සැප වේදනාවක්ම අනිත්‍ය වුණා. ඒ වගේ සංසාරේ සතර අපායන්ට පටිච්ච සමුප්පන්නව වැටුණ වෙලාවේ, අර නිරයන්ට වැටුණ වෙලාවේ, ගින්දර ලෝදියත් එක්ක කොයි සා දුක් වේදනාවන් විඳින්න ඇත්ද? තිරිසන් සත්තු වෙලා ඉපදුන වෙලාවේ මනුස්සයෝ අපේ බෙල්ල කපාගෙන, මරාගෙන කද්දි කොයි සා දුක් වේදනාවන් අපි විඳින්න ඇත්ද? සෑම දුක් වේදනාවක්ම අනිත්‍ය වුණා. එයා සකස් වෙන දුක් වේදනාව විදර්ශනාවෙන් දකිනවා.

ඊළඟට එයා උපේක්ෂා සහගත විඳීම් දකිනවා. මේ ඇලීම් ගැටීම් දෙකෙන් බැහැර වෙලා උපේක්ෂාව තුළ සමාධිමත් සිතෙන් කොච්චර නම් මම ගත කරන්න ඇත්ද? පලමුවෙනි, දෙවැනි, තුන්වැනි, හතරවැනි ධ්‍යාන සකස් කරගෙන කොච්චර නම්

කාලයක් ජීවත් වෙන්න ඇත්ද? අරූපාවචර ධ්‍යාන සකස්කරගෙන කොච්චර කාලයක් ඉන්න ඇත්ද? සෑම උපේක්ෂා සහගත සිතක්ම අනිත්‍ය වුණා කියලා එයා දකිනවා පින්වතුනි.

අන්න ඊලඟට එයා චිත්තානුපස්සනාව දකිනවා. සුන්දර චිත්තානුපස්සනාව ජීවිතයෙන් වඩනවා. තමා තුළ සකස් වෙන සෑම සිතුවිල්ලක්ම එයා අනිත්‍යයි කියලා දකිනවා පින්වතුනි. තමා තුළ මෛත්‍රී සිතක් ඇති වුනත් අනිත්‍යයි කියලා දකිනවා. එයා දකිනවා සංසාරේ මට කොච්චර නම් මෛත්‍රී සිත් ඇති වෙන්න ඇත්ද? සංසාරේ මම මෛත්‍රිය වඩලා, කොච්චර නම් රූපාවචර අරූපාවචර බ්‍රහ්ම තලවල ධ්‍යාන සුවයෙන් ඉන්න ඇත්ද? ඒ මෛත්‍රියත් අනිත්‍ය වුණා කියලා එයා දකිනවා.

ඒ වගේම එයා ද්වේශ සිතක් සකස් වුණත් ඒ ද්වේශ සිතත් අනිත්‍යයි කියලා එයා දකිනවා. සංසාරයේ ද්වේශ සිත් සකස් වීම නිසා කොයි සා සතර අපායට වැටුණත් ඒ සියළු සංස්කාරයන් අනිත්‍යයි කියලා එයා දකිනවා.

අන්න පින්වතුනි චිත්තානුපස්සනාව තුළ ශක්තිමත් වුනා. එයා ඇස් දෙක පියාගෙන දකිනවා අද උදේ ඉදන් මේ වෙනකම් තමන්ට හිත් කී දාහක් ඇති වෙන්න ඇත්ද? උදේ ඇහැරෙන්න කියලා හිත කිවුවා. තේ බොන්න කියලා හිත කිව්වා. කෑම කන්න කියලා හිත කිව්වා. මෙතනට එන්න කියලා හිත කිව්වා. මේ සෑම හිතක්ම අනිත්‍ය වෙලා ගියා පින්වතුනි. මේ හිත අනිත්‍ය වෙලා ගියේ අපව ක්‍රියාත්මක භාවයට පත් කරලයි.

නමුත් මේ ක්‍රියාත්මක භාවය නිසා අපි සෑම මොහොතකම මොකද කරන්නේ? එක්කෝ කුසලයක් රැස් කරනවා. එක්කෝ අකුසලයක් රැස් කරනවා පින්වතුනි. ඒ කුසල් අකුසල් නිසා අපි නිරතුරුව තව, තව, තව, තව භවය ශක්තිමත් කර ගන්නවා. අන්න එයා අනිත්‍ය වූ සිත අනිත්‍ය වශයෙන් දකිනවා. ඔබ සකස් කර ගන්නා වූ සෑම සිතුවිල්ලක් පාසාම ඔබ මේ වර්තමානය තුළ ඉදන් අනාගත භවය සකස් කර ගන්නවා පින්වතුනි.

එහෙනම් ඔබ මේ සකස් වෙන සිත අනිත්‍යයි කියලා දකින මොහොතේ ඔබ චිත්තානුපස්සනාව තුළ ශක්තිමත්. ඒ අනිත්‍යයි කියලා දකින සිත අනාගතය උදෙසා භවය සකස් කරන්නේ නෑ, පින්වතුනි.

ඊලඟට ඔබ සුන්දර ධම්මානුපස්සනාව වඩනවා. ඒ ධම්මානුපස්සනාවේදී ඔබ තුළ සකස් වෙන සෑම පංච නීවරණ ධර්මයක්ම ඔබ අනිත්‍ය වශයෙන් දකිනවා. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්දච්චකුක්කුච්ඡ, විචිකිච්ඡා අනිත්‍ය වශයෙන් දකිනවා.

තමා තුළ වැඩෙන සප්ත බොජ්ඣංග ධර්ම සති, ධම්මවිචය, වීර්ය, ප්‍රීති, පස්සද්ධි, සමාධි, උපේඛා, අනිත්‍ය වශයෙන් දකිනවා. ඇයි දැන් දකින්නේ? මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය. එයා දැන් අනිත්‍යය හඳුනා ගත්තා. උපක්ලේශයන් හඳුනා ගත්තා. උපක්ලේශයන්ට එයා රැවටෙන්නේ නෑ පින්වතුනි.

එයා දැන් භාවනා කරද්දි දිව්‍ය රූපයක් දැක්කොත් ඒක අනිත්‍ය වූ රූපයක්, අනිත්‍ය වූ සිතක් පමණයි. එයා චිත්තානුපස්සනාව තුළින් දිව්‍ය රූපයට එයා පිළිතුරු දෙනවා. එයා අමනුෂ්‍ය රූපයක් දැක්කොත් ඒ අමනුෂ්‍ය රූපයත් එයාට අනිත්‍ය වූ රූපයක් පමණක් මයි. එයාට ආලෝක සංඥාවක් පෙනුණොත් ඒ ආලෝක සංඥාවත් එයාට අනිත්‍ය වූ රූපයක් පමණයි පින්වතුනි. උපක්ලේශයන්ගෙන් බැහැර වුණා. නැවත උපක්ලේශයන්ට එයාව රවට්ටන්න බෑ. භාවනාවේදී උඩ යනවා කියලා එයාට තේරුණොත් ඒක හිතක් කියලා දැකලා ඒ හිතේ අනිත්‍ය භාවය, චිත්තානුපස්සනාව එයා වඩනවා. එයාට පා වෙනවා කියලා දැනුණොත් ඒ සකස් වුණේ හිතක්. ඒ කියන්නේ අනිත්‍ය වූ පංචුපාදානස්කන්ධයක්. අන්න එයා ඒ හිත අනිත්‍යයි කියලා දකිනවා. අන්න මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය.

මාර්ගය හඳුනා ගත්තා. නැවත වරදින්නේ නෑ පින්වතුනි. අන්න සුන්දර තැන. මේ ධර්ම මාර්ගය තුළ සෝවාන් ඵලය කරා යන පින්වතා මේ මග්ගා මග්ග ඤාණ දස්සන විශුදධිය කියන තැන

පින්වතුනි ශක්තිමත් තැනක්. නැවත එයා ආපසු හැරෙන්නේ නෑ. එයාට වංචා කරන්න, එයාට බොරු කරන්න, එයාව රවට්ටන්න පංච උපාදානස්කන්ධ මාරයාට දැන් සීයට සීයක්ම පුළුවන්කමක් නෑ පින්වතුනි. දැන් එයා මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධියෙන් ශක්තිමත්.

පස්වෙනි රථයට එයා නැගලා ඉන්නේ. දැන් එයා මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධියෙන් පින්වතුනි දැන් නගින්න යන්නේ හය වන රථයටයි. **නමුත් පින්වතුන්ලා හොඳට තේරුම් ගන්න මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය කියන රථයේදිත් තවම එයා සෝවාන් ඵලයට පත් වෙලා නෑ පින්වතුනි. තාම එයා සෝවාන් ඵලයට පත් වුණේ නෑ. මාර්ගය හඳුනා ගත්තා, පමණක්මයි.**

මාර්ගය හඳුනා ගත්ත තැන අන්න එයා පස්වෙනි රථයෙන් බැහැලා හයවෙනි රථයට ගොඩ වෙනවා. ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධිය. **අන්න එතනදී එයා උතුම් සෝවාන් ඵලය සාක්ෂාත් කර ගන්නවා.** ඒ කියන්නේ මේ හයවෙනි අශ්ව රථයට නගින තැනදී අන්න උතුම් සෝවාන් ඵලය සාක්ෂාත් වන තැනයි මෙතන පින්වතුනි.

ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධිය. ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධියදී මොකද කරන්නේ? එයා මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධියේ දී එයා අනිත්‍ය සංඥාව වඩනවා. කායානුපස්සනාව, චිත්තානුපස්සනාව, වේදනානුපස්සනාව, ධම්මානුපස්සනාව වඩනවා. උපක්ලේශයන්ට එයා කොටු වෙන්නේ නෑ පින්වතුනි. එයා සෑම උපක්ලේශයකින්ම පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය මතුකර ගන්න දක්ෂයි. දැන් එයා පංචුපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකින කෙනෙක්.

ලොව්තුරා බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා යම් කෙනෙක් උතුම් සෝවාන් ඵලයට පත්වුණා නම් එයාට කරන්න තියෙන්නේ එකම එක කාර්යයයි කියලා. එයාට කාර්යයන් දෙකක් කරන්න නැහැ කියලා කියනවා පින්වතුනි. මොකද එයාට ශීලය පිළිබඳ

ප්‍රශ්නයක් නැහැ. ශීලය ආර්ය ශීලයක් හැටියට වැඩිලා. එයාට ශ්‍රද්ධාව පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ශ්‍රද්ධාව ආර්ය ශ්‍රද්ධාවක් හැටියට වැඩිලා.

එයාට කරන්න තියෙන්නේ එකම එක කාර්යයයි. මොකක්ද සෝවාන් ඵලයට පත්වුන, අර්ථවත් ආකාරයෙන් සෝවාන් ඵලයට පත්වුන කෙනාට කරන්න තියෙන්නේ? පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් දැකීමයි පින්වතුනි. අන්න බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. තමන් අනිත්‍ය වශයෙන් දැක්කා වූ පංච උපාදානස්කන්ධය තව දුරටත් එයා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණයන්ගේ අනිත්‍ය භාවය දකිනවා.

එයා මේ පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකින කොට අන්න බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා එයා උතුම් සකෘදාගාමි ඵලයට පත්වෙනවා කියලා.

ඊළඟට බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා සකෘදාගාමී ඵලයට පත් වුන කෙනාට කරන්න කාර්යයන් දෙකක් නෑ. එක කාර්යයයි තියෙන්නේ. තව දුරටත් එයා පංච උපාදානස්කන්ධයේ අනිත්‍යය දකිනවා. පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකිනවා කියන්නේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණයන්ගේ අනිත්‍ය භාවය දකිනවා.

එහෙම දකිද්දි අන්න එයා උතුම් අනාගාමී ඵලයට පත්වෙනවා පින්වතුනි. උතුම් අනාගාමී ඵලයට පත්වෙච්ච කෙනාටත් කරන්න කාර්යයන් දෙකක් නෑ. එක කාර්යයයි බුදු රජාණන් වහන්සේ දේශනා කරන්නේ. ඒ මොකක්ද? අනාගාමී ඵලයට පත්වුන කෙනා තව දුරටත් පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකිනවා.

**පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකිද්දි අන්න පින්වතුනි උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගත්ත රහතන් වහන්සේ කෙනෙක් බවට පත්වෙනවා.**

එහෙනම් මේ ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධියේදී ඔහු නැවත උපක්ලේශයන්ට රැවටීමක් නෑ. මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධියේදී ඔහු උපක්ලේශ හඳුනා ගත්තා. උපක්ලේශ පරාජය කළා.

ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධිය කියන තැනදී උතුම් සෝවාන් ඵලය සාක්ෂාත් කළා. ඒ ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධිය ශක්තිමත් කරමින් අන්න පින්වතුනි ඊට පස්සේ හත්වෙනි අවසාන රථයට ගොඩ වෙනවා. හත්වෙනි අවසාන රථය තමයි ඤාණ දස්සන විශුද්ධිය.

ඤාණ දස්සන විශුද්ධිය කියන්නේ උතුම් රහත් ඵලයයි පින්වතුනි. උතුම් රහත් ඵලයයි, ඤාණ දස්සන විශුද්ධිය කියලා කියන්නේ.

රහතන් වහන්සේ යනු භව නිරෝධයට අවශ්‍ය සියල්ල පරිපූර්ණ කළ උත්තමයෙක්. උන් වහන්සේට තවත් කළ යුතු කාර්යයක්, උන්වහන්සේ උදෙසා නැහැ. උන් වහන්සේ මේ දුකින් පෙළෙන සත්වයා උතුම් චතුරාර්ය සත්‍යය දකිත්වා, අවබෝධ කරත්වා, කුසලය තුළ ශක්තිමත් වෙත්වා කියන විදර්ශනාත්මක ඡන්දය තිබෙනවා. ඉහත ඡන්දයට අදාලව, සත්ත්වයාට, චතුරාර්ය සත්‍යය දේශනා කිරීමට විදර්ශනාත්මක වීර්යය තිබෙනවා. ඉහත විදර්ශනාත්මක වීර්යයට අදාලව, තම අතීත සංස්කාරයන්ට අදාලව ගෙවීයන ජීවිතය සත්ත්වයාගේ යහපත උදෙසාම කැපවෙත්වා, කියන විදර්ශනාත්මක චිත්තය තිබෙනවා. ඉහත සියළු සංස්කාරයෝ අනිත්‍යයි කියලා අවබෝධාත්මකව දකින විමංසාව තුළ ජීවත්වීම රහතන් වහන්සේ නමකගේ සතර ඍද්ධිපාද ධර්මයන්ගෙන් පෝෂණය වුණ ජීවිතයක එකම අර්ථය වෙනවා.

මේ මාර්ගය තුළ ගමන් කරන කෙනා මුලින්ම කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබනවා. දෙවනුව සද්ධර්මය ශ්‍රවණය කරනවා. තුන්වෙනුව ශ්‍රවණය කලා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරනවා. ඒ තුළින් එයා ලෞකික ප්‍රඥාව ශක්තිමත් කර ගන්නවා. ඒ කියන්නේ සම්මා දිට්ඨිය සම්මා සංකප්පය ශක්තිමත්.

එයා පලමුවෙනි රථයට නැග්ගා. ශීල විශුද්ධිය. දෙවන රථයට නැග්ගා. චිත්ත විශුද්ධිය. තුන්වන රථයට නැග්ගා. දිට්ඨි විශුද්ධිය. හතරවෙනි රථයට නැග්ගා. කංඛාවිතරණ විශුද්ධිය. පස්වෙනි රථයට නගිනවා. මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය. මාර්ගය සුන්දරව හඳුනා ගත්තා. එයාව ආයිමත් රවට්ටන්න බෑ. එයා ආයිමත් හැරෙන්නේ නෑ, පින්වතුනි. හයවෙනි රථයට නගිනවා. ප්‍රතිපදා ඤාණදස්සන විශුද්ධිය. අන්න එයා ප්‍රතිපදා ඤාණදස්සන විශුද්ධිය තුලින් උතුම් සෝවාන් ඵලය සාක්ෂාත් කර ගන්නවා. ප්‍රතිපදා ඤාණදස්සන විශුද්ධියේදී තව දුරටත් පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකිමින් ම, හත්වන අවසාන රථයට, ඤාණදස්සන විශුද්ධිය කියන රථයට නගිනවා. අන්න පින්වතුනි, එහිදී උතුම් චතුරාර්‍ය සත්‍යය අවබෝධ කර ගන්නවා.

ඔන්න පින්වතුනි සප්ත විශුද්ධීන්. දැන් පින්වතුන්ලා මගෙන් ප්‍රශ්නයක් හැටියට මතුකලේ සප්ත විශුද්ධීන් තුළින් ආර්ය අෂ්ටාංගික මාර්ගය මතුකරලා පෙන්වන්න කියලා. දැන් මම මුලින් කිව්ව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශීල විශුද්ධිය, චිත්ත විශුද්ධිය කියන තැනට එද්දි, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මාර්ග අංග අටම වැඩිලා පින්වතුනි. මොකද ශීලයට අදාල සම්මා වාචා, කම්මන්තෝ, ආජීවෝ, ශීල විශුද්ධියේදී වැඩෙනවා. සම්මා වායාමෝ, සම්මා සති, සම්මා සමාධි පින්වතුනි චිත්ත විශුද්ධියේදි වැඩෙනවා.

ශීල විශුද්ධිය කියන රථයට නගින්න ඉස්සෙල්ලා එයා කල්‍යාණ මිත්‍ර ආශ්‍රය සද්ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම තුළ එයා ලෞකික ප්‍රඥාව එහෙමත් නැත්නම් සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය ශක්තිමත් කෙනෙක් පින්වතුනි.

## අතුරු ප්‍රශ්නය

### ඤාණ දස්සන විශුද්ධියට අනුව සියුම් හෝ ක්ලේශයක් තමන් තුළ ඉතිරිව ඇත්දැයි දැකීමට තරම් ඤාණයක් නේද ස්වාමීන් වහන්ස පුද්ගලයෙක් තුළ මේ අවස්ථාවේදී ඇතිවන්නේ?

එහෙයි. අනිවාර්යයෙන්ම එයා දකිනවා මේ මනුස්ස ලෝකය තුළ එයා හිත පිහිටුවමින්, හිත පිහිටුවමින් දකිමින්, දකිමින් දකිනවා මේ මනුස්ස ලෝකයේ ශ්‍රේෂ්ඨම කෙනා සක්විති රජ්ජුරුවොයි, මේ සක්විත් රජ තනතුර කෙරෙහි තමාගේ සියුම් වූ තෘෂ්ණාවක් තියෙනවද කියලා එයා දකිනවා. මොකද ඒ ඉදිකටු තුඩක තරම් වූ සියුම් වූ තෘෂ්ණාවක් මනුස්ස ලෝකය තුළ තිබ්බොත් නැවත උපාදානය මනුස්ස ලෝකය තුළම වෙන්න පුළුවන්. මොකද ඉදිකටු තුඩක තරම් තෘෂ්ණාවක් එතන තියෙනවා.

ඒ නිසා එයා තමා තුළින් තමා පීර පීරා, පීර පීරා බලනවා. මනුස්ස ලෝකය කෙරෙහි තමන් කැමති කලා වූ ආශා කළා වූ මේ සෑම දේවල් දිහාම නුවණින් දැකලා එය බලනවා. මනුස්ස ලෝකයේ ඉදිකටු තුඩක තරම්වත් බැසගන්න තෘෂ්ණාවක් එයාට තියෙනවද කියලා.

එහෙම බලලා එයා ප්‍රත්‍යක්ෂව දැනගන්නවා එයා මනුස්ස ලෝකය කෙරෙහි එයාට ඉදිකටු තුඩක තරම්වත් තෘෂ්ණාවක් නැහැයි කියලා. ඊලඟට එයා පීර පීරා, පීර පීරා බලනවා දිව්‍යතල කෙරෙහි තෘෂ්ණාවක් තියෙනවද කියලා. එයා ශක්‍රයා විඳින්නා වූ සැපයන් දැකලා. සුජම්පතිය විඳින්නා වූ සැපයන් දැකලා ඒ සැපයනුත් අනිත්‍ය වූ ධර්මතාවයක් කියලා එයා දකිනවා.

ඒ තුළින් එයා ප්‍රත්‍යක්ෂ කරගන්නවා දිව්‍ය තලයේ මේ ශක්‍රයා කියන සැපය කෙරෙහිවත් එයාගේ තෘෂ්ණාවක් නැහැ කියලා. ඊලඟට එයා රූපාවචර, අරූපාවචර අනාගාමී බ්‍රහ්ම තලයන් පීර පීරා, පීර පීරා බලනවා. මේ සියල්ලම අනිත්‍ය වන සංස්කාරයන් කියලා එයා දකිනවා. එයා බලනවා මහා බ්‍රහ්මයා කියන අර්ථය කෙරෙහි එක ඉදිකටු තුඩක තරම්වත් තෘෂ්ණාවක් තමා තුළ

තියෙනවද කියලා එයා පීර පීර බලනවා. බලද්දි එයා දකිනවා එහෙම තෘෂ්ණාවක් නැහැයි කියලා.

ඊට පස්සේ බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා යමෙකුට මනුස්ස ලෝකය කෙරෙහි තෘෂ්ණාව අතහැරුණා නම්, දිව්‍යතල කෙරෙහි තෘෂ්ණාව අතහැරුණා නම්, බ්‍රහ්මතල කෙරෙහි තෘෂ්ණාව අතහැරුණා නම්, එයාගේ හිත පිහිටන්නේ නිවන කෙරෙහියි කියලා. නිවන තුළයි කියලා. ඒ කියන්නේ ඤාණ දස්සන විශුද්ධිය.

තමන් නිදහස් වුනාය කියන කාරණය අන්න එතනින් තමයි දකින්නේ. එහෙනම් මේ තමන් නිදහස් වුනාය කියන කාරණය දකිනවා කියන්නේ පින්වතුනි එහෙනම් මේ මාර්ගයක ඵලයක්මයි. එතකොට මේ ශීල විශුද්ධියේ පටන් මේ ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධිය දක්වාම සම්පූර්ණයෙන්ම ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෞකික වශයෙනුත්, ලෝකෝත්තර වශයෙනුත් වැඩිලා අහවරයි. තේරුණාද?.

රථ විනීත සූත්‍රයේ දේශනා කරන මෙන්න මේ විශුද්ධීන් සියල්ල තුළ අනිවාර්යයෙන්ම පින්වතුනි, මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෞකික සහ ලෝකෝත්තර වශයෙන් සම්පූර්ණයෙන්ම වැඩෙනවා ඒ ලෞකික ලෝකෝත්තර වශයෙන් වැඩිලා සම්මා ඤාණ තුළින් තමයි සම්මා විමුක්තිය සාක්ෂාත් කරලා දෙන්නේ. එතකොට ඒ සම්මා විමුක්තිය සාක්ෂාත් කර ගත්ත, ඒ ඤාණ දස්සන විශුද්ධිය පරිපූර්ණ කරගත්ත දවසකට, ඔබ වේවා, මම වේවා අපි උතුම් රහත් ඵලයට පත්වුනු බවට පත් වෙනවා.

ඒ උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගත්තා කියන්නේ, මේ භව ගමන නිමා කළාය කියන්නේ පින්වතුනි අපි මේ මාර්ගය තුළ ගමන් කරලා, නිවැරදිව මේ මාර්ගය තරණය කරලා උතුම් ඤාණ දස්සන විශුද්ධියෙන් පරිපූර්ණ වෙච්ච තැන. ඒ උතුම් ඤාණ දස්සන විශුද්ධිය කවදාහරි ඔබ හෝ මම හෝ කවුරුන් හෝ පරිපූර්ණ කර ගත්ත තැනදී, එයා උතුම් රහතන් වහන්සේ කෙනෙක් බවටයි පත්වෙන්නේ.

**ඒ රහතන් වහන්සේ මෙන්න මේ වගේ කෙනෙක් වෙනවාය කියලයි මම නම් හිතන්නේ. කොයි වගේ කෙනෙක්ද? එයා කාටවත්ම නොදැනී, කාටවත්ම නොපෙනී, ධර්මය නමැති මහා කඳු මුදුනට නගිනවා. කොහොමද නැග්ගේ? කාටවත්ම නොදැනී, කාටවත්ම නොපෙනී, ධර්මය නමැති මහා කඳු මුදුනට නැගලා, ඒ කඳු මුදුනේ සිට දැකිය යුතු සියල්ල දැකලා, බැලිය යුතු සියල්ල බලලා, අවබෝධ කළ යුතු සියල්ල අවබෝධ කරලා, කාටවත්ම නොපෙනෙන්න, කාටවත්ම නොදැනෙන්න, ඒ කඳු මුදුනෙන් කඳු පා මුලට බැහැලා, නිසොල්මනේ ජීවත් වෙන කෙනෙකුටයි රහතන් වහන්සේ කියලා කියන්නේ. වෙන කෙනෙකුට නෙවෙයි. තේරුණාද?**

එහෙනම් අර සා ගමනක් ඇවිල්ලා පින්වතුනි අවසානේ අපි ලබන ඵලය මොකක්ද? කාටවත් නොපෙනී, කාටවත් නොදැනී, ධර්මය නමැති මහා කඳු මුදුනට නැගලා, ඒ කඳු මුදුනේ සිට දැකිය යුතු සියල්ල දැකලා, බැලිය යුතු සියල්ල බලලා, අවබෝධ කල යුතු සියල්ල අවබෝධ කරලා, කාටවත් නොදැනී, කාටවත් නොපෙනී, ඒ කඳු මුදුනෙන් කඳු පාමුලට බැහැලා, කාත් කවුරුවත් නැතුව ජීවත් වෙන, අනුන්ගේ සිවුපසයෙන් යැපෙන, කාත් කවුරුවත් නැති මරණයක් උරුම කර ගත්තාවූ උත්තමයාටයි කවදාහරි පින්වතුනි රහතන් වහන්සේ කියලා කියන්නේ.

එහෙනම් අවසාන වශයෙන් අපි ලබපු දෙයක් තියෙනවද? ලැබුව දෙයක් නැහැ. කාත් කවුරුවත් නැති මරණයක්, අනුන්ගේ සිවුපසයෙන් යැපෙන ජීවිතයක්, කාත් කවුරුවත් නැති ජීවිතයක් ලබන කෙනාටයි අවසානෙදි රහතන් වහන්සේ කියන්නේ තේරුණාද?.

එහෙනම් ඉතින් අඬ බෙර ගහන්න දෙයක් එතන තියෙනවද? ලෝකෙට කියන්න දෙයක් තියෙනවද? කාත් කවුරුවත් නැති, කාත් කවුරුවත් නැති මරණයක් උරුම කර ගන්න, අනුන්ගෙ න් යැපෙන කෙනාටයි අවසානේ ඔබ රහත් වුනත් අපට

යන්න තියෙන්නේ ඔතනට. එතනට යන්න නම් පින්වතුනි අනිවාර්යයෙන්ම මේ මාර්ගය නිවැරදිව වඩන්න ඕන.

මේ මාර්ගය නිවැරදිව වැඩුවේ නැත්නම් අවසාන ඵලය හැටියට බිහිවන රහතන් වහන්සේ කියන්නේ මුළු ලෝකයටම විහිළුවක්. නාමික රහතන් වහන්සේලා.

වර්තමානේ එහෙම තැන් ගොඩක් තියෙනවා නේද? අපට ඇහෙනවනේ නේද? ඒ ඇහෙන්නේ කුමක් නිසාද? මේ මාර්ගය පරිපූර්ණව වැඩිලා නැහැ. මේ මාර්ගය පරිපූර්ණව වැඩුනා නම් අවසානයේ බිහි වෙන්නා වූ රහතන් වහන්සේ කියන්නේ කාත් කවුරුවත් නැති, කාත් කවුරුවත් නැති මරණයක් උරුම කර ගන්න, අනුන්ගේ සිවුපසයෙන් යැපෙන උත්තමයායි. ඔච්චරයි තියෙන්නේ. අවසානය ඔතනයි.

### අතුරු ප්‍රශ්නය

### මහ රහතන් වහන්සේලා දෙදෙනා අතර පවත්නා සාකච්ඡාව එතනින් අවසන් වෙනවද ස්වාමීන් වහන්ස

නැහැ. කවුද මේ දේශනාව කරන්නේ? මන්තානිපුත්ත පුණ්ණ ස්වාමීන් වහන්සේ. උන් වහන්සේ රහතන් වහන්සේ කෙනෙක්. දැන් මේ රහතන් වහන්සේ මේ සියළු දේ ප්‍රකාශ කලේ කාටද? ශාරිපුත්ත මහ රහතන් වහන්සේට. එතකොට තවම මේ මගේ ඉස්සරහ මේ වැඩ ඉන්නේ ශාරිපුත්ත මහ රහතන් වහන්සේ බව පුණ්ණ ස්වාමීන් වහන්සේ දන්නේ නැහැ. නමුත් ශාරිපුත්ත රහතන් වහන්සේ දන්නවා මේ පුණ්ණ ස්වාමීන් වහන්සේ කියලා. උන්වහන්සේව හොයාගෙනමයි ආවේ.

දැන් අවසානේ පුණ්ණ ස්වාමීන් වහන්සේ ශාරිපුත්ත ස්වාමීන් වහන්සේට මේ සියළුම ධර්මයන් දේශනා කළාට පස්සේ ඊලඟට ශාරිපුත්ත මහ රහතන් වහන්සේ අහනවා, "ආයුෂ්මතුන්, ඔබ වහන්සේගේ නම කියන්න" කියලා, මේ වගේ සුන්දර ධර්මයක්

දේශනා කළා වූ. එතකොට තමයි කියන්නේ "මම මන්තානි පුත්ත පුණ්ණ ස්වාමීන් වහන්සේ" කියලා.

ඒ වෙලාවේ ශාරිපුත්ත මහරහතන් වහන්සේ "අනේ සාදු! සාදු! ඔබ වහන්සේ බුදු රජාණන් වහන්සේ පවා වර්ණනා කළාවූ භික්ෂුවක්" කියලා කියනවා. එහෙම කියද්දි පුණ්ණ ස්වාමීන් වහන්සේ අහනවා "ඔබ වහන්සේගේ නම කියන්න" කියලා. ඒ වෙලාවේ ශාරිපුත්ත මහ රහතන් වහන්සේ කියනවා "මම තමයි ශාරිපුත්ත මහ රහතන් වහන්සේ" කියලා. ඒ වෙලාවේ පුණ්ණ ස්වාමීන් වහන්සේ කියනවා "අනේ මහෝත්තමයාණන් වහන්ස, මේ සා අවබෝධයෙන් පිරුණු මේ සා උතුම් ස්වාමීන් වහන්සේ නමක් මගේ ඉස්සරහා ඉන්නවා කියලා මම හීනෙකින්වත් හිතුවේ නැහැ".

"ශාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ මගේ ඉස්සරහා ඉන්නේ කියලා මම නම් එක මොහොතක් වත් හිතුවේ නැහැ. මට එහෙම හිතුනා නම්, මේ කිසිම උපමාවක් මගේ මතකයට එන්නේ නැතුව ඉන්න තිබුණා" කියලා. "මොකද ඔබ වහන්සේගේ ශ්‍රේෂ්ඨ භාවය, ජ්‍යෙෂ්ඨ භාවය ඔබ වහන්සේගේ කරුණාව දැකලා. ඒ නිසාම මේ කිසිම උපමාවක් මගේ මතකයට එන්නේ නැතිව තියෙන්න තිබුණා" කියලා රහතන් වහන්සේලා දෙනමම ඒ පින අනුමෝදන් වෙලා එතනින් ඒ කාරණය අවසන් වෙනවා.

ඒ කාරණය අවසන් වුනත් ඒ උතුම් ධර්මය වර්තමාන සමාජයට ගොඩක් වටිනවා. මොකද වර්තමාන සමාජය මේ අඩු මාර්ග වලින් කෙටි මාර්ග වලින් නිවන් සොයා යන මාවත් වලට යන්න යොමු වෙලා තියෙනවා. මේ අඩු මාර්ග කෙටි මාර්ග ඔස්සේ නිවන් සොයා යන ගමනක් යන්න යනවා.

ඒ සියල්ල සකස් වෙන්නේ පින්වතුනි කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය වෙනුවට අසත්පුරුෂ ආශ්‍රයන් සොයා යාමෙන්. එතකොට ඒ අසත්පුරුෂ ආශ්‍රයන් නිසා කළ්‍යාණ මිත්‍ර නොවන ආශ්‍රයන් නිසා බුදු රජාණන් වහන්සේ දේශනා කලේ නැති, විකෘති ධර්මයන්

ඇහෙන්න ලැබෙනවා. ඒ විකෘති ධර්මයන් ඇහෙන්න ලැබෙන නිසාම පින්වතුනි, මේ සැබෑ මාර්ගයෙන් බාහිර මාර්ගවල ගිහිල්ලා ධර්මයේ නාමයෙන් මිථ්‍යා දෘෂ්ඨිය තමයි අපි වැළඳ ගන්නේ.

නමුත් ඉතින් අනිත්‍යය වඩනවා "මම සෝවාන් වෙලා" කියලත් හිතනවා. නමුත් අනිත්‍ය වැඩුවත් සෝවාන් වුනා කියලා කිවුවත් පින්වතුනි තමන් ඉන්නේ මිථ්‍යා දෘෂ්ඨිය තුළයි. මොකද කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් සැබෑ මාර්ගයේ නෙවෙයි ගියේ. වෙන වෙන කවුරුන් හෝ ගිහි කෙනෙක් කියන බණක්, දෙවි කෙනෙක් කියලා කියාගත්ත කෙනෙක් කියන බණක්, බ්‍රහ්මයෙක් කියලා කියාගත්ත කෙනෙක් කියන බණක්, මේවා ඔස්සේ ඇදන් ගිහිල්ලා ඔන්න පින්වතුනි සම්පූර්ණ මිථ්‍යා දෘෂ්ඨියක් කරායි අවසානේ ගිහිල්ලා නතර වෙලා තියෙන්නෙ.

ඒ නිසා වර්තමාන සමාජයේ මේ ප්‍රවණතාවය හුඟක් වැඩියි. ඒ නිසා නිරතුරුව ඔබ දක්ෂ වෙන්න බුදු රජාණන් වහන්සේ දේශනා කළා වූ සැබෑ ධර්ම මාර්ගය වැටිලා තියෙන කල්‍යාණ මිත්‍ර ආශ්‍රය සද්ධර්ම ශ්‍රවණය නුවණින් මෙනෙහි කිරීම, ඒ වගේම උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයට බැස ගැනීම, ඒ තුළින් ශීල විශුද්ධිය, ශීල විශුද්ධිය තුළින් චිත්ත විශුද්ධිය, චිත්ත විශුද්ධිය තුළින් දිට්ඨි විශුද්ධිය, දිට්ඨි විශුද්ධිය තුළින් කංඛාවිතරණ විශුද්ධිය, කංඛාවිතරණ විශුද්ධිය තුළින් මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය, මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය තුළින් ප්‍රතිපදා ඤාණ දස්සන විශුද්ධිය ඔස්සේ ඤාණ දස්සන විශුද්ධිය කියන, මම නිදහස් වුණාය කියන සැබෑම නිදහස් වීම කියන කාරණය සාක්ෂාත් කර ගන්න.

එසේ නොවුනොත් අපි නිදහස් වීම කියන කාරණය තුළ සමහර විට බරපතල මිථ්‍යා දෘෂ්ඨික භාවයන් වැළඳ ගන්නත් පුළුවන්.

- නිමි -

සාධු ..... සාධු ..... සාධු .....

**සබ්බ දානං ධම්ම දානං ජිනාති**
**සියලු දානයන් අතර ධර්ම දානයම අග්‍රවන්නේය.**

# පුණ්‍යානුමෝදනාව

- මෙම ධර්ම දානමය කුසල් බෙලෙන් අප සැමට උතුම් දහම් මග පෙන්වා දෙන සිල්වත් වූ, ගුණවත් වූ, උත්තම පුණ්‍ය ක්ෂේත්‍රයක් බඳු වූ, ඉතා දුර්ලභව අප ලද බුද්ධ පුත්‍රයන් වහන්සේ වන අති පූජ්‍ය රාජගිරියේ අරියඥාණ ස්වාමීන් වහන්සේ ඇතුළුව උතුම් සදහම් මඟ අප සැමට විවර කරදෙනු ලබන සියලුම මහා සංඝරත්නයට, නිදුක් නිරෝගී චිර ජීවනය ලැබේවා ! අප සැමට තව තවත් සදහම් මග විවර කිරීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය සහ නිරෝගි සුවය ලැබේවා !

- මහේෂාක්‍ය, අල්පේෂාක්‍ය, දිව්‍යරාජ සමූහය ද මේ උතුම් ධර්ම දානමය පින අනුමෝදන්ව සම්මා සම්බුද්ධ ශාසනය චිරාත් කාලයක් රැකදේවා!

- මෙම උතුම් ධර්ම දානය ලබන ඔබ සියලු දෙනාටත්, ධර්ම ග්‍රන්ථය ඉදිරිපත් කළ, සකස් කළ සියලු දෙනාටත්,

- මෙම උතුම් ධර්මදානය සඳහා දායක වූ සියළු දෙනාටත්, ලංකාව පුරා බෙදාහැරීමට දායක වන සියළු ආයතන හිමි මහත්ම මහත්මීන්ටත් පුද්ගලිකවම එම උතුම් කාර්යයේ නියැලෙන සියළු දෙනාටත්,

**මෙම ඝෝර කටුක භයානක සංසාරයේ බිය දක මේ ආත්ම භවයේදීම සසර දුකින් එතෙර වීමට මෙම ධර්ම දානමය කුසල කර්මය හේතු වේවා! පාරමිතාවක්ම වේවා !**

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ
# සප්ත විශුද්ධි ධර්ම

මේ මාර්ගය තුළ ගමන් කරන කෙනා මුලින්ම කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලබනවා. දෙවනුව සද්ධර්මය ශ්‍රවණය කරනවා. තුන්වෙනුව ශ්‍රවණය කලා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරනවා. ඒ තුළින් එයා ලෞකික ප්‍රඥාව ශක්තිමත් කර ගන්නවා. ඒ කියන්නේ සම්මා දිට්ඨිය සම්මා සංකප්පය ශක්තිමත්.

එයා පලමුවෙනි රථයට නැග්ගා. ශීල විශුද්ධිය. දෙවන රථයට නැග්ගා. චිත්ත විශුද්ධිය. තුන්වන රථයට නැග්ගා. දිට්ඨි විශුද්ධිය. හතරවෙනි රථයට නැග්ගා. කංඛාවිතරණ විශුද්ධිය. පස්වෙනි රථයට නගිනවා. මග්ගා මග්ග ඤාණ දස්සන විශුද්ධිය. මාර්ගය සුන්දරව හඳුනා ගත්තා. එයාව ආයිමත් රවට්ටන්න බෑ. එයා ආයිමත් හැරෙන්නේ නෑ, පින්වතුනි. හයවෙනි රථයට නගිනවා. ප්‍රතිපදා ඤාණදස්සන විශුද්ධිය. අන්න එයා ප්‍රතිපදා ඤාණදස්සන විශුද්ධිය තුලින් උතුම් සෝවාන් ඵලය සාක්ෂාත් කර ගන්නවා. ප්‍රතිපදා ඤාණදස්සන විශුද්ධියේදී තව දුරටත් පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දකිමින් ම, හත්වන අවසාන රථයට, ඤාණදස්සන විශුද්ධිය කියන රථයට නගිනවා. අන්න පින්වතුනි, එහිදී උතුම් චතුරාර්‍ය සත්‍යය අවබෝධ කර ගන්නවා.

ISBN 978-955-7887-32-6

9 789557 887326

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්